NDB
ක්‍රෙඩිට් කාඩ්ස්

ක්‍රෙඩිට් කාඩ්පත් හිමියන්ගේ ගිවිසුම සඳහා වන නීතිරීති සහ කොන්දේසි

හිතවත් මහත්මයාණෙනි/මහත්මියෙනි/මෙනවියෙනි,

ඔබේ සැබෑ අවශ්‍යතාවන්ට සරිලන NDB ක්‍රෙඩිට් කාඩ්පත අප ඔබට පිරිනමන්නේ ඉමහත් සතුටිනි.

මෙම ක්‍රෙඩිට් කාඩ්පත මගින් ලොව පුරා ඔබ යන එන ඕනෑම ස්ථානයකදී වැඩි පහසුවක් හා ආරක්ෂාවක් සැලසෙන පරිදි මයික්‍රොචිප් අධිතාක්ෂණික ආරක්ෂණයක් ඔබට ලබා දී ඇත. ලොව පුරා මිලියන 25කටත් වැඩි වෙළෙඳ ආයතනවල දී හා මිලියනයකටත් වැඩි ATM යන්ත්‍රවලදී අපේ උණුසුම් සේවය ඔබට හිමිවේ.

ඔබේ ජීවිතය වෙනස්කර ගැනීමට මෙම ක්‍රෙඩිට් කාඩ්පත ඉවහල් වනු ඇතැයි අප තරයේම විශ්වාස කරමු.

මෙයට - විශ්වාසී,

ගිහාන් ඩයස්

අංශ ප්‍රධානි

කාඩ්පත් හා විකල්ප බෙදාහැරීමේ මාර්ග

සාමාන්‍ය උපදෙස්

කාඩ්පතේ ආරක්ෂාව - ඔබේ කාඩ්පත නැතිවුනොත් හෝ සොරකම් කර ඇති බව දැනගත්තොත් වහාම, (+94) 11 2 448 888 හෝ (+94) 772 448 888 අංක ඔස්සේ අපේ පාරිභෝගික සේවා මධ්‍යස්ථානයට දැනුම් දෙන්න. මෙම අංක දවසේ පැය 24 පුරාම ක්‍රියාත්මක වේ. ඉන් පසු හැකිතාක් ඉක්මනින්, ලිඛිතව ද දැනුම් දෙන්න. ඔබේ කාඩ්පතේ රහස්‍ය අංකය කාඩ්පත සමග ලියා නොතැබීමට හෝ වෙනත් අයෙකුට හෙළිදරව් නොකිරීමට වගබලාගැනීම, ඔබේ වගකීමයි.

ණය සීමාව - ඔබේ ණය සීමාව ඉක්මවා ගනුදෙනු කළොත්, දඩ මුදලක් ලෙස අමතර වැඩි පොලියක් ගෙවීමට ඔබට සිදුවේ. මෙසේ නියමිත ණය සීමාව ඉක්මවන ඔබේ ගනුදෙනුව ප්‍රතික්ෂේප වනු ඇත. වැඩි ණය සීමාවක් ලබාගැනීමට අවශ්‍ය නම්, කාඩ්පත් මධ්‍යස්ථාන කළමනාකරුගෙන් ලිඛිතව ඉල්ලා සිටිය යුතුය.

මුදල් ලබාගැනීම - ඔබ ණය සීමාව ඉක්මවා නැත්නම්, ඔබේ ණය සීමාවෙන් 50% ක් දක්වා ඕනෑම VISA ATM ජාලයකින්, මුදල් ලබාගත හැක.

අලුත් කාඩ්පතක් ලබාගැනීම සඳහා - භාවිතා කිරීමට නොහැකි තත්ත්වයට පත් වූ කාඩ්පත වෙනුවට අලුත් කාඩ්පතක් ලබාගැනීමට, (+94) 11 2 305 031 අංකයට හෝ (+94) 11 2 44 88 88 හෝ (+94) 77 2 44 88 88 අංකයට දැනුම් දී, ඔබේ ලිඛිත ඉල්ලීම පැරණි කාඩ්පත සමග අප වෙත එවන්න.

වෙනත් සේවා - ඔබගේ ක්‍රෙඩිට් කාඩ්පතට මෙම අතිරේක පහසුකම් ද හිමිවේ.

- කාඩ්පතින් කළ ගනුදෙනු පිළිබඳ, SMS මගින් ඔබේ ජංගම දුරකථයට නොමිලේම දැනුම්දීම.
- කාඩ්පත සඳහා සම්පූර්ණයෙන් හෝ කොටසක් පමණක් ගෙවීමට, ඔබේ ඉතුරුම් හෝ ජංගම ගිණුමට ස්ථාවර නියෝග ලබාදීමේ හැකියාව.

මතක තබාගත යුතු තවත් කරුණු

- කාඩ්පතේ ඔබේ අත්සන යෙදූ විට, කාඩ්පත ඉදිරිපස සහ පසුපස ඡායාපිටපත් ලබාගෙන ළඟ තබාගන්න.
- අලුතින් කාඩ්පතක් ලබාගත් විට හෝ පැරණි කාඩ්පත වෙනුවට අලුතින් කාඩ්පතක් ගත්විට, පුද්ගලික රහස්‍ය අංකය ඔබට ලැබෙන තුරු, ATM ජාලවලින් මුදල් ලබාගැනීමට භාවිතා නොකළ යුතුය. කාඩ්පතේ මතුපිට සඳහන් කර ඇති කල් ඉකුත් වන දිනයෙන් පසු, කාඩ්පත විනාශ කර දමන්න.
- කාඩ්පතින් ගනුදෙනු කිරීමේදී ලැබෙන රිසිට්පත් සුරක්ෂිතව තබාගැනීමෙන්, පසුව ඔබට බැංකුවෙන් ලැබෙන ප්‍රකාශනය සමග සසඳා බැලිය හැක.

- ඔබගේ කාඩ්පත නැතිවුවහොත් හෝ සොරකම් කර ඇති බව දැනගත්තොත්, වහාම (+94) 11 2 44 88 88 ඔස්සේ අපට දැනුම් දෙන්න.
- PIN අංකය (පුද්ගලික රහස්‍ය අංකය) මතකයේ තබාගෙන PIN අංකය දන්වා එවූ ලිපිය විනාශ කරන්න.
  * රහස්‍ය අංකය කාඩ්පතේ ලියා තබන්න එපා! කාඩ්පත, මුදල් පසුම්බිය සමග නැතිවීමට හෝ සොරකම් කිරීමට ඉඩ ඇති නිසා රහස්‍ය අංකය සඳහන් කිසිවක් මුදල් පසුම්බිය තුළ නොතැබිය යුතුය.
- ඔබේ මුදල්වල ආරක්ෂාව තහවුරු කිරීමට, අවශ්‍ය යැයි සිතෙන අවස්ථාවලදී බැංකුව විසින් ඔබ ඇමතීමට ඉඩ ඇත. පහත ක්‍රියාමාර්ග මගින්, ඒ සඳහා අපට සහාය වීමට ඔබට හැක:
  - ඔබේ ලිපිනය, දුරකථන අංක හා ජංගම දුරකථන අංක ආදී තොරතුරු වෙනස් වූ විට, අපට නොපමාව දැනුම් දෙන්න.
  - ඔබ විදේශගත වන්නේ නම්, අපට දැනුම් දෙන්න. (අපගේ (+94) 11 2 44 88 88 පාරිභෝගික සේවා අංකය, පැය 24 පුරා ඔබ වෙනුවෙන් ක්‍රියාත්මක ය.)
- ගෙවීම් ක්‍රම
  - ස්ථාවර නියෝග - ස්වයංක්‍රීය ගෙවීම්:
    ඔබේ NDB බැංකු ගිණුමෙන්, අවම මුදලට වැඩි ඕනෑම මුදලක් (සම්පූර්ණ ගෙවීම දක්වා) ගෙවීමට ස්ථාවර නියෝගයක් නිකුත් කළ හැක.
  - ශාඛා මගින්.

සේවා පහසුකම	ශාඛා	බැංකු වේලාවන්
NDB බැංකු ශාඛා	සියලුම ශාඛා	පෙ.ව. 9.00 සිට ප.ව. 3.00
සෙනසුරාදා බැංකු සේවා	නුගේගොඩ, පැලවත්ත, මොරටුව, පිළියන්දල, යාපනය	පෙ.ව. 9.00 සිට ප.ව. 1.00
වසරේ දින 365 විවෘත	රාජගිරිය, ගල්කිස්ස	පෙ.ව. 9.00 සිට ප.ව. 8.00
වසරේ දින 365 විවෘත	හැව්ලොක් ටවුන්	පෙ.ව. 9.00 සිට ප.ව. 6.00

NDB බැංකුව
කාඩ්පත් සේවා අංශය
103A, ධර්මපාල මාවත, කොළඹ 07.
දුරකථන: (+94) 11 2 44 88 88, (+94) 772 44 88 88
ෆැක්ස්: (+94) 11 2 305 031

NDB බැංකුවේ ක්‍රෙඩිට් කාඩ්පත ලැබුණු වහාම ඔබ කළ යුතු දේ

1. මතුපිටට නෙරා සිටින සේ මුද්‍රණය කර ඇති ඔබගේ නම නිවැරදි දැයි බලන්න.

2. නව කාඩ්පතේ අත්සන් තැබීමට පෙර NDB බැංකු කාඩ්පත් හිමියාගේ ගිවිසුම් කියවන්න.

   ඔබ කාඩ්පතේ අත්සන් තැබීමෙන් පසු කාඩ්පත් හිමියාගේ ගිවිසුමේ අඩංගු සියලු කොන්දේසි හා වගන්ති ඔබ විසින් පිළිගෙන ඇති බවත් එම ගිවිසුමින් ඔබ බැඳී ඇති බවත් අදහස් වේ.

3. ඔබේ NDB ක්‍රෙඩිට් කාඩ්පත නැතිවූ විට හෝ සොරකම් කර ඇති අවස්ථාවකදී NDB බැංකුවේ පාරිභෝගික සේවා මධ්‍යස්ථානයට ඒ බව දැනුම් දීමට අමතන්න +94 11 2 44 88 88 හෝ ෆැක්ස් +94112305031 නැතිනම් ළඟම NDB බැංකු ශාඛාවට දන්වන්න. එසේම ඔබේ කාඩ්පත නැතිවූ බව ලිඛිතව NDB කාඩ්පත් මධ්‍යස්ථානයට දන්වන්න.



1. මේ ඔබගේ අංක 16කින් යුතු කාඩ්පත් අංකයයි. බැංකුව සමග සිදු කරන ඕනෑම සංනිවේදන කටයුත්තකදී මෙම අංකය භාවිත කරන්න.
2. ඔබ මෙම කාඩ්පතෙහි සඳහන් මාසයේ, වර්ෂය දක්වා කාඩ් ගිණුමක් හිමි සාමාජිකයෙකි.
3. ඔබේ කාඩ්පත මෙහි සඳහන් වර්ෂයේ, මාසයේ අවසාන දිනය දක්වා වලංගු වේ.
4. **වීසා ලාංඡනයः** මෙම ලාංඡනය දැක්වෙන ඕනෑම වෙළඳ ආයතනයක හෝ ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍රයක ඔබේ කාඩ්පත භාවිත කළ හැක.
5. **ඇමතුම් අංකය -** ඔබගේ කාඩ්පත සම්බන්ධ තොරතුරු විමසීම සඳහා පැය 24 පුරාම විවෘත දුරකථන අංකය.
6. **කාන්දම් තීරුව -** වැදගත් තොරතුරු මෙම තීරයේ අඩංගු වේ. කරුණාකර ඔබේ කාඩ්පත සීරීම්වලින් හෝ පලුදුවීම්වලින් ආරක්ෂා කර ගන්න. එමෙන්ම කාන්දම් හෝ කාන්දම් ක්ෂේත්‍රවලට නිරාවරණය වීමෙන් ද වළක්වා ගන්න.
7. **අත්සන යොදන ස්ථානය -** මෙම ස්ථානයේ කඩිනමින් ඔබගේ අත්සන නොමැකෙන ආකාරයට යොදන්න. එය ඔබගේ අයකිරීම් ලදුපතෙහි යොදන අත්සනම විය යුතුය.
8. **CVV2 -** ඉලක්කම් 3කින් සමන්විත කාඩ්පතෙහි සත්‍යතාවය තහවුරු කිරීමේ අංකය.
9. බැංකුවේ ලිපිනය, ෆැක්ස්, ඊ මේල් ලිපිනය ආදිය.

කාඩ් හිමියා සමග ගිවිසුම
නීතිරීති හා කොන්දේසි

වැදගත්: ව්‍යාපාර ලියාපදිංචි අංක PQ 27 දරන නැෂනල් ඩිවෙලොප්මන්ට් බැංකුව PLC වෙතින් ලැබෙන මෙහි අඩංගු කාඩ්පත අත්සන් කිරීම හෝ පාවිච්චි කිරීමට පෙර කරුණාකර කාඩ් හිමියාගේ ගිවිසුම ප්‍රවේශමෙන් කියවන්න. කාඩ්පත පිළිගැනීම හා/හෝ/අත්සන් තැබීම හා/හෝ/පාවිච්චි කිරීම මගින් ඔබ පහත සඳහන් නියමයන් හෝ කොන්දේසි පිළිගන්නා අතර ඒවායින් බැඳී සිටී.

1. අර්ථ නිරූපණයන්

1.1 **"ATM"** යනු බැංකුව හෝ කලින් කලට බැංකුව විසින් නම් කරන ලද බැංකුවට අයත් හෝ අයත් නොවන වෙනත් ඕනෑම එක්ව කටයුතු කරන බැංකුවක හෝ මූල්‍ය ආයතනවල ඇති කාඩ්පත පිළිගන්නා ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍රයක් හෝ කාඩ්පත ක්‍රියාකරවිය හැකි යන්ත්‍රයක් හෝ යාන්ත්‍රික ක්‍රමයක් වේ.

1.2 **"අයදුම්කරු"** යනු කාඩ් අයදුම්පත්‍රයක් අත්සන් කර ඇති ඕනෑම පුද්ගලයෙකි.

1.3 **"බැංකුව"** යනු නැෂනල් ඩිවෙලොප්මන්ට් බැංකුව PLC එහි අනුප්‍රාප්තිකයන් සහ නියැදුම්කරුවන් වේ.

1.4 **"කාඩ්පතක්"** යනු බැංකුව එහි කාඩ් හිමියෙකුට නිකුත් කරන ලද ගෙවීම් කාඩ්පතක් ප්‍රාථමික, අතිරේක හෝ පැරණි කාඩ්පතක් වෙනුවට නිකුත් කරන ලද ප්‍රතිපූර්ණ කාඩ්පතක් වේ.

1.5 **"කාඩ් ගිණුම"** යනු කාඩ් ගනුදෙනු සඳහා බැංකුව විසින් පවත්වාගෙන යනු ලබන ගිණුමකි.

1.6 **"කාඩ් මධ්‍යස්ථානය"** යනු NDB බැංකුවෙහි ණය කාඩ් මධ්‍යස්ථානයයි.

1.7 **"කාඩ් හිමියා"** යනු ගිවිසුමේ නියමයන් හා කොන්දේසි පරිදි බැංකුව විසින් ප්‍රාථමික කාඩ්පතක් හා/හෝ අතිරේක කාඩ්පතක් නිකුත් කරනු ලැබූ කාඩ් ගිණුමෙහි සියලුම ගනුදෙනු සඳහා වගකිව යුතු හා බැඳීම්වලට යටත් පුද්ගලයාය.

1.8 **"කාඩ් ගනුදෙනුව"** යනු ඕනෑම භාණ්ඩයක්, සේවාවක් සහ හෝ ප්‍රතිලාභයක් සඳහා කරන ගෙවීමක්, හා ඕනෑම පුණ්‍ය කටයුත්තක් හා ඕනෑම මුදල් අත්තිකාරමක්ද ඇතුලුව කාඩ් හිමියාගේ දැනුම ඇතිව හෝ නොමැතිව කාඩ්පතක් භාවිතා කරමින් හෝ කාඩ් ගිණුම හා අංකය හෝ පුද්ගල රහස්‍ය අංකය භාවිතා කරමින් හෝ වෙනත් ඕනෑම ආකාරයකින් හෝ සීමා කිරීමකින් තොරව වෙනත් ක්‍රමයකින් එනම් තැපැල් දුරකථන ඇනවුම්, දුරකථන බැංකු සේවාව (Call Banking),

විද්‍යුත් පසුම්බිය, අන්තර්ජාලය, ජංගම දුරකථනය හරහා කරන වාණිජ කටයුතු හෝ වෙන් කරවා ගැනීම් (ඒ ඒ සේවාවන්/බැංකු නිෂ්පාදන වලට අදාළ කොන්දේසිවල විස්තර කර දක්වා ඇති පරිදි කාඩ් හිමියා විසින් හෝ ඔහු විසින් බලය පවරන ලද පරිදි) කරනු ලබන ගනුදෙනුවකි.

1.9 **"මුදල් අත්තිකාරම"** යනු කාඩ් ගිණුමේ හරට බැංකුවෙන් හෝ වෙනත් බැංකුවකින් කාඩ්පත, කාඩ් අංකය හෝ පුද්ගල රහස් අංකය භාවිතා කරමින් කාඩ් හිමියා විසින් අනුමත කරන ලද මුදල් ලබා ගැනීමේ ක්‍රියාවකි.

1.10 **"ගාස්තු"** යනු කාඩ් ගිණුමට හර කරනු ලබන හා පවත්නා ශේෂය අන්තර්ගතවන සීමාවකට යටත් නොවන සියලු කාඩ් ගනුදෙනු, ගාස්තු, මුදාහැරීම් ඇතුළත් වන කාඩ්පත භාවිතා කිරීම හෝ කාඩ් අංකය හෝ පුද්ගල රහස් අංකය මෙම නියමයන් හා කොන්දේසි වලට යටත්ව භාවිතා කිරීම හේතු කොටගෙන කාඩ් හිමියා වෙතින් අයවිය යුතු මුදල් වේ.

1.11 **"ආයතනික කාඩ්පත"** යනු මාණ්ඩලික සාමාජිකයන්, විධායක නිලධාරීන්, අධ්‍යක්ෂවරුන් හෝ සුදුසුකම් ලත් ආයතනික දේහයක් විසින් බලය පවරනු ලැබූ ඕනෑම පුද්ගලයෙකු වෙත නිකුත් කරන ලද කාඩ්පතක්/පත් වේ.

1.12 **"ණය සීමාව"** යනු ප්‍රාථමික කාඩ්පතක් හෝ (ඇත්නම්) අතිරේක කාඩ්පතක් වෙනුවෙන් වූ කාඩ් ගිණුමක් සඳහා බැංකුව විසින් අනුමත කරන ලද උපරිම හර ශේෂයයි.

1.13 **"ප්‍රවර්තන ශේෂය"** යනු බැංකුවේ වාර්තා අනුව ගිණුම් ප්‍රකාශනය නිකුත් කරන දිනයට (කාඩ් ගිණුමට හර කළ යුතු සියලු ගාස්තු ද ඇතුළත්) කාඩ් ගිණුමෙහි හිඟව ඇති හා බැංකුවට ගෙවිය යුතුව ඇති මුළු හර ශේෂයයි.

1.14 **"තැන්පතුව"** යනු කාඩ් හිමියාගේ බැඳීම් ඉටු කිරීම සඳහා සහ/හෝ කාඩ්පත/පතක් නිකුත් කිරීම සඳහා සුරැකුමක් ලෙස බැංකුවේ තබා ඇති මුදල් ප්‍රමාණය වේ.

1.15 **'සමූහ සාමාජික'** යනු බැංකුවේ උප සමාගමක් හෝ ආශ්‍රිත සමාගමක් වේ.

1.16 **"ඇපකරය"** යනු කාඩ්පත් හිමියාගේ බැඳීම් ඉටුකිරීම සඳහා සහ/හෝ කාඩ්පත/කාඩ්පතක් නිකුත් කිරීම සඳහා සුරැකුමක් ලෙස බැංකුව විසින් නියමිත ලෙස නියම කරන ලද මුදලක් සඳහා බැංකුවක්, ආයතනික දේහයක්, හවුල් ව්‍යාපාරයක්, පුද්ගලයෙක් හෝ බැංකුවට පිළිගත හැකි ආකාරයකින් නිකුත් කරන ලද ඇපකරයකි.

1.17 **"(Imprinter) මුද්‍රිකය"** යනු කාඩ් ගනුදෙනු අතින් ක්‍රියාකරන උපකරණයක් මගින් සකස් කර දෙන ක්‍රමවේදයකි.

1.18 **"(IVR Interactive Voice Response System) අන්තර් ක්‍රියාකාරික හඬ ප්‍රතිචාරක පද්ධතිය"** යනු කාඩ් ගිණුම පිළිබඳව විමසීම් හා සේවා භාවිතයද අඩංගු එහෙත් ඊට පමණක් සීමා නොවූ කාඩ්පත මගින් එක්තරා ගනුදෙනු කරගෙන යාම සඳහා කාඩ් හිමියෙකු හට ඉලෙක්ට්‍රෝනික ප්‍රවේශය සපයා දෙන උපකරණයකි.

1.19 **"වෙළෙන්දා"** යනු බැංකුව විසින් කාඩ් හිමියාගේ ගෙවුම් මාධ්‍යය ලෙස කාඩ්පත හෝ කාඩ්පත් අංකය භාරගෙන භාණ්ඩ හා/හෝ සේවාවන් විකිණීම පිණිස බැංකුව විසින් පිළිගනු ලැබූ ඕනෑම ආයතනයක්, හවුල් ව්‍යාපාරයක්, පුද්ගලයෙක් හෝ වෙනත් ආයතනයකි.

1.20 **"අයවිය යුතු අවම මුදල"** යනු ගෙවීම කළ යුතු දිනට ගෙවනු ලැබුවහොත් ප්‍රමාද ගෙවීම් ගාස්තුවට කාඩ් ගිණුම යටත් නොවන ප්‍රවර්තන ශේෂයෙන් කිසියම් අවම ප්‍රතිශතයකටත් වූ හා කිසියම් සීමාවකට (පනවා ඇත්නම්) ඉහළින් පිහිටි මුදල් ප්‍රමාණයකි.

1.21 **"මාසය"** යනු ලිත් මාසයකි.

1.22 **"කල් ඉකුත් වූ මුදල"** යනු කාඩ් හිමියාගේ කලින් ලද ගිණුම් ප්‍රකාශනයේ ගෙවිය යුතු මුදල (ඇත්නම්) ලෙස දැක්වෙන මුදලයි. ගිණුම් ප්‍රකාශනයේ කල් ඉකුත් වූ මුදල ලෙස පෙන්වා ඇත ප්‍රමාණය අයවිය යුතු අවම මුදලට ඇතුළත් වී ඇති අතර එය වහාම ගෙවිය යුතුය.

1.23 **"අධි සීමා මුදල"** යනු ණය සීමාව ඉක්මවන ප්‍රවර්ථන ශේෂයයි.

1.24 **"අධි සීමා ගාස්තුව"** ගිණුම් ප්‍රකාශනය අනුව කාඩ් හිමියා තම ණය සීමාව ඉක්මවා ගියහොත් අය කෙරෙන ගාස්තුවයි.

1.25 **"ගෙවීම නියමිත දිනය"** යනු බැංකු නිවාඩු දිනයක් හෝ සති අන්ත දිනයක් වේ නම් කාඩ් හිමියාගේ ගෙවීම නියමිත දිනය වනුයේ යම් නිවාඩු දිනයක්/සති අන්තයක් ගෙවී ඊළඟට එළඹෙන පළමු වැඩ කරනු දිනයයි.

1.26 **"රහස්‍ය අංකය"** යනු ස්වයංක්‍රීය යන්ත්‍රයක් මගින් ඉලෙක්ට්‍රෝනිකව කාඩ්පත පාවිච්චි කිරීම සඳහා සහාය කරගන්නා, කාඩ්පත් හිමියා වෙත නිකුත් කරන ලැබූ පුද්ගල හැඳුනුම් අංකයයි.

1.27 **"POS"** යනු කාඩ් ගනුදෙනු ඉලෙක්ට්‍රෝනිකව සකස් කරනු ලබන විකුණුම් ස්ථාන පර්යන්තය (Point of Sale).

1.28 **"ප්‍රාථමික කාඩ් හිමියා"** යනු කාඩ්පතක් නිකුත් කරනු ලැබීමට හා කාඩ් ගිණුමක් පළමුව විවෘත කර පවත්වාගෙන යාමට බැංකුව විසින් පිළිගනු ලැබූ අතිරේක කාඩ් හිමියෙකු නොවන පුද්ගලයාය.

1.29 **"රු"** යනු ශ්‍රී ලංකා රුපියල් වේ.

1.30 **"සුරැකුම"** යනු කාඩ්පත් හිමියාගේ වගකීම් ඉටු කිරීම සඳහා සහ/හෝ කාඩ්පත/පතක් නිකුත් කරනු ලැබීම සඳහා සුරැකුමක් ලෙස තබා ගන්නා ලද තැන්පතුවක් හෝ ඇපකරයකි.

1.31 **"ගිණුම් ප්‍රකාශනය"** යනු බැංකුවට ගෙවිය යුතු වත්මන් ශේෂය පිළිබඳ විස්තර රැගත් බැංකුව විසින් මාසිකව හෝ වෙනත් කාල වකවානුවක් අනුව කාඩ්පත් හිමියා වෙත එවනු ලබන ප්‍රකාශනයයි.

1.32 **"ප්‍රකාශනයේ දිනය"** යනු බිල්පත් නිකුත් කිරීමේ චක්‍රයේ අවසාන දිනය වන අතර එකී ප්‍රකාශනයේ එම දිනයේ ව්‍යාපාර කටයුතු අවසාන වනතෙක් එකී ගිණුමට බැංකුව විසින් සිදු කළ සියලු ප්‍රවේශයන් අඩංගු වේ.

1.33 **"අතිරේක කාඩ්පත"** යනු ප්‍රාථමික හිමියා විසින් බැංකුව සමග ගිවිසුමකට එළඹීමේදී ප්‍රාථමික කාඩ් හිමියා විසින් නම් කර ඉල්ලා සිටිනු ලැබූ පුද්ගලයෙකි.

1.34 **"අතිරේක කාඩ් හිමියා"** යනු අතිරේක කාඩ්පතක් නිකුත් කරනු ලැබූ පුද්ගලයාය.

1.35 **"පර්යන්තය"** යනු කාඩ් ගනුදෙනු ඉලෙක්ට්‍රෝනිකව ඉටු කර දෙන ඕනෑම ස්වයංක්‍රීය මුදල් යන්ත්‍රයක් හෝ (ATM) හෝ විකුණුම් ස්ථාන පර්යන්තය (POS) කි.

1.36 **"ගනුදෙනු දිනය"** කාඩ් හිමියා සහ වෙළෙන්දා අතර කාඩ් ගනුදෙනුව සිදු කළ දිනය වේ.

1.37 **"ගනුදෙනු ක්‍රියාකාරක (තහවුරු) දිනය"** යනු කාඩ් ගනුදෙනුව කාඩ් ගිණුම වෙත සම්ප්‍රේෂණය කරනු ලැබූ දිනයකි.

1.38 **"උපයෝගීතාව"** යනු ජලය, විදුලිය, හා සන්නිවේදන සේවාවන්ද ඇතුළත් එහෙත් ඊටම සීමා නොවූ භාණ්ඩ හා සේවාවන් හා අනෙකුත් උපයෝගීතා සේවාවන් සපයන ඕනෑම අධිකාරියක් හෝ ආයතනයක් වේ.

විශේෂයෙන් සඳහන් කළයුතු නොවේ නම්, පුරුෂ ලිංග වශයෙන් සඳහන්ව ඇති කරුණු, පුරුෂ ලිංග නොවන අනෙකුත් පාර්ශ්වයන්ට ද අදාළ වේ.

2. කාඩ්පත

2.1 කාඩ්පත බැංකුව සතු වස්තුවක් වන අතර බැංකුව විසින් ඉල්ලූ විටෙක කාඩ් හිමියා විසින් වහාම බැංකුව වෙත භාර දිය යුතුය.

2.2 කාඩ්පත අන් අයෙකුට පැවරිය නොහැකි වන අතර කාඩ් හිමියා විසින්ම පමණක් භාවිතා කළ යුතුය. කිසිම අවස්ථාවකදී කාඩ් හිමියා තම කාඩ්පත හෝ පුද්ගල හැඳුනුම් අංකය වෙනත් කිසිම පුද්ගලයෙකුට භාවිතා කිරීමට ඉඩ නොදිය යුතුය. කාඩ් හිමියා විසින් මොනයම් හෝ කරුණක් උදෙසා කාඩ්පත ඇපයකට භාවිතා නොකළ යුතුය.

2.3 බැංකුවට සිය පූර්ණ අභිමතය පරිදි කිසිදු පූර්ව දැනුම්දීමකින් හා හේතුවකින් තොරව ඕනෑම අවස්ථාවක කාඩ්පත සහ එය පාවිච්චි කිරීමට කාඩ් හිමියාට දී ඇති අයිතිය ආපසු ලබා ගැනීමට ද ඕනෑම කාඩ් ගනුදෙනුවක් අනුමත කර ගැනීම සඳහා කෙරෙන ඉල්ලීමක් ප්‍රතික්ෂේප කිරීමටද පුළුවන.

2.4 බැංකුවට සිය පූර්ණ අභිමතය පරිදි කාඩ්පතක් නැවත නිකුත් කිරීමට, අලුත් කිරීමට හෝ ඒ වෙනුවෙන් නව කාඩ්පතක් නිකුත් කිරීමට හෝ එසේ කිරීම ප්‍රතික්ෂේප කිරීමට පුළුවන.

2.5 කාඩ් හිමියෙකු නිරතුරුවම තම කාඩ්පත සුරක්ෂිත ස්ථානයක තබා ගත යුතුය.

3. කාඩ්පතක් භාරදීම හා පාවිච්චිය

3.1 කාඩ්පතක් කාඩ් හිමියා විසින්ම ලබා ගැනීමට හෝ කාඩ් හිමියා විසින් බැංකුවට දී ඇති ලිපිනයට තැපෑලෙන් හෝ කුරියර් සේවය බැගින් (ගෙන ගොස් භාරදීමට) යැවීමට හෝ නම් කරන ලද තෙවන පාර්ශ්වයකට පැමිණ ලබා ගැනීමට/භාරදීමට පුළුවන. එහි අවදානම කාඩ් හිමියා දැරිය යුතුය.

3.2 කාඩ්පත ලද සැනින් කාඩ් හිමියා එහි පසුපස තම අත්සන තැබිය යුතු අතර, එසේ අත්සන් තැබීම සහ/හෝ ක්‍රියාත්මක කරවීම සහ/හෝ කාඩ්පත පාවිච්චි කිරීම මගින් මෙහි සඳහන් නියමයන් හා කොන්දේසි පිළිගත් බවට වගකීමෙන් බැඳෙන අතර එය ඊට අවසානාත්ම සාක්ෂියක්ද වේ.

3.3 මෙම නියමයන් හා කොන්දේසි වලින් බැඳී සිටීමට කාඩ් හිමියා අපේක්ෂා නොකරන්නේ නම් කාඩ් හිමියා කාඩ්පත දෙකට කපා එම කොටස් දෙක බැංකුව වෙත භාරදීම මගින් **17 වැනි වගන්තිය (සමාප්ත කිරීම)** යටතේ ඉන් ඉදිරියට කාඩ්පත අක්‍රීය කළ හැක.

3.4 කාඩ්පත පාවිච්චි කිරීමේදී එය මෙම ගිවිසුමෙහි සියලු නියමයන්ට යටත් වේ.

3.5 කාඩ්පත ණය සීමාව යටතේ පමණක් පාවිච්චි කළ හැක.

3.6 කාඩ්පත පාවිච්චි කිරීම පිළිබඳව බැංකුව විසින් කලින් කලට දෙනු ලබන පහසුකම් හා ප්‍රතිලාභ ලබාගැනීමට කාඩ් හිමියාට පුළුවන.

3.7 බැංකුවට සිය පූර්ණ අභිමතය මත හා පූර්ව දැනුම් දීමකින් තොරව කාඩ්පතෙහි (එම්බෝස්) මුද්‍රණය කර ඇති වලංගු කාලසීමාව තුළදී ඕනෑම වේලාවක කාඩ්පත පාවිච්චි කිරීමේ අයිතිය ආපසු ලබා ගැනීමට හෝ කිසියම් කාඩ් ගනුදෙනුවක් වලංගු කිරීම සඳහා කෙරෙන ඉල්ලීමක් ප්‍රතික්ෂේප කර එවැනි ආපසු ගැනීමක් හා ප්‍රතික්ෂේප කිරීමක් ප්‍රසිද්ධ කිරීමට පුළුවන.

3.8 කාඩ් හිමියන් විසින් මෙම කාඩ්පත ප්‍රාග්ධන ගනුදෙනු සඳහා හෝ වාණිජ කටයුතු සඳහා භාණ්ඩ ආනයනය කිරීමට යොදවා නොගත යුතුය.

3.9 කාඩ්පත ශ්‍රී ලංකාවෙන් පිටතදී පාවිච්චි කිරීම ශ්‍රී ලංකා මහ බැංකුව, විනිමය පාලන දෙපාර්තමේන්තුව හෝ වෙනත් ඕනෑම නියාමන අධිකාරියක් විසින් නියම කෙරෙන පරිදි සිදු කළ යුතුය. තමන්ට එරෙහිව ශ්‍රී ලංකා මහ බැංකුවේ, බැංකුවේ උසාවියක් හෝ ඕනෑම නියාමන අධිකාරියක් අයිතිවාසිකමකට, සහනයකට හෝ කෘත්‍යයකට අගතියක් නොවන පරිදි ගෙවීමට ඇති සියලු මුදල් පියවීමේ වගකීම කාඩ් හිමියා සතුය.

3.10 කාඩ් ගිණුමෙහි තත්ත්වය එහි අවසාන දිනය තෙක් වලංගුව පැවතීමේ කොන්දේසියට යටත්ව කාඩ්පතෙහි එම්බෝස් (මුද්‍රණය) කර ඇති අවසාන දිනය තෙක් කාඩ් ගනුදෙනු සඳහා පාවිච්චි කිරීමට කාඩ් හිමියාට පුළුවන.

3.11 කාඩ්පත හා බැංකුව සම්බන්ධ සියලු ගනුදෙනු වලදී සෑම විටෙකම සද්භාවයෙන් යුතුව කටයුතු කිරීමට කාඩ් හිමියා භාරගනී.

4 රහස්‍ය අංකය (PIN) නිකුත් කිරීම සහ කාඩ්පත සහ රහස්‍ය නැතිවීම

4.1 කාඩ්පත සහ කාඩ් හිමියා පිළිගන්නා ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍රයක් මගින් කාඩ් හිමියෙකුට කාඩ්පත භාවිතා කළ හැකි පුද්ගල හැඳුනුම් අංකය (PIN) බැංකුව විසින් නිකුත් කරන අතර බැංකුව විසින් PIN අංකය තැපෑලෙන් හෝ කුරියර් සේවය මගින් කාඩ් හිමියාගේ අවදානම යටතේ යැවීමට එකඟ වේ.

4.2 PIN අංකය භාවිතා කරමින් කරනු ලබන සියලුම ගනුදෙනු පිළිබඳව කාඩ් හිමියා පූර්ණ වගකීම දරනු ඇත.

4.3 කාඩ්පත හා අංකය නැතිවීම හෝ සොරා ගැනීම වළක්වා ඒවායේ සුරක්ෂිත භාවයද තහවුරු කිරීමට කාඩ් හිමියා හැකි සෑම ආරක්ෂාවක්ම යෙදිය යුතුය.

4.4 කාඩ්පතක් නැතිවීමේ හෝ සොරකම් කිරීමක දී එකී නැතිවීම හෝ සොරකම් කිරීම පිළිබඳ විස්තර කාඩ් හිමියා විසින්ම වහාම දුරකථනය, ෆැක්ස් හෝ ටෙලෙක්ස් මගින් බැංකුවට හෝ අදාළ ගෙවීම් ආයතනයේ ඕනෑම සාමාජික බැංකුවකට හෝ එකී නියෝජිත කාර්යාලයකට සහ එම නැතිවීම/සොරකම් කිරීම සිදු වූ රටේ පොලීසියට දැන්විය යුතුය. නමුත් එවන් අවස්ථාවක දුරකථන ෆැක්ස් හෝ ටෙලෙක්ස් පණිවුඩය ලද බවට ලිඛිතව තහවුරු කළ යුතුය.

4.5 කාඩ්පතක අනවසර පාවිච්චියේ ප්‍රතිඵලයක් ලෙස කාඩ් ගිණුමට හර කෙරෙන සියලුම මුදල් පිළිබඳව, එහි නැතිවීම හෝ සොරකම් කරනු ලැබීම පිළිබඳව දැන්වීමක් කර පසුව බැංකුව වෙත ලිඛිතව තහවුරු කරන තෙක් කාඩ් හිමියා වගකිව යුතු වේ.

4.6 කාඩ්පතක් නැතිවීම, සොරකම් කිරීම හෝ අනවසරව භාවිතා කිරීම පිළිබඳ කාඩ් හිමියා සන්තකයේ ඇති සියලු තොරතුරු බැංකුවට ලබා දිය යුතු අතර නැතිවූ/සොරකම් කරනු ලැබූ කාඩ්පත සොයා ගැනීමට සහාය වේ යැයි බැංකුව අදහස් කරන සියලු පියවරයන් කාඩ් හිමියා විසින් ගත යුතුය.

4.7 නැති වූ හෝ සොරකම් කරනු ලැබූ කාඩ්පතක් සඳහා ප්‍රතිපූර්ණ කාඩ්පතක් නිකුත් කිරීම හෝ බැංකුව විසින් සුදුසු යැයි අදහස් කරන මෙම නියමයන් හා කොන්දේසි වලට යටත්ව PIN අංකයක් නිකුත් කිරීම බැංකුව විසින් සිය පූර්ණ අභිමතය පරිදි කරනු ඇත.

4.8 කාඩ් හිමියා විසින් නැතිවූ හෝ සොරකම් කරන ලද කාඩ්පත නැවත කාඩ් හිමියා විසින් සොයා ගතහොත් එය නැවත පාවිච්චි නොකර කැබලි දෙකකට කපා බැංකුව වෙත ආපසු යැවිය යුතුය. PIN අංකය වෙනත් අයෙකු හට හෙළිදරව් වීම ගැන බැංකුවට වාර්තා කළ පසු කාඩ්පතෙහි PIN අංකය පාවිච්චි නොකළ යුතුය.

4.9 නැතිවූ කාඩ්පත් වෙනුවෙන්, වෙළෙඳ ජාලයට දැන්වීමට සහ නව කාඩ්පතක් නිකුත් කිරීමට වැයවූ පරිපාලන වියදම් ආවරණය කර ගැනීම පිණිස බැංකුව විසින් ගාස්තුවක් අය කරනු ඇත.

5. කාඩ් ගිණුම

5.1 කාඩ් ගනුදෙනුවල මුදල්, බැංකුවට අයවිය යුතු ගාස්තු හා බැංකුව විසින් දරන ලද නීති ගාස්තු සහ අනික් සියලුම පරිපාලන වියදම් ඇතුලු වෙනත් ඕනෑම වගකීමක් හා කාඩ්පත භාවිතා කිරීම නිසා බැංකුවට දැරීමට සිදු වූ ඕනෑම අලාභයක් බැංකුව විසින් කාඩ් ගිණුමට හර කරනු ලැබිය හැක. විකුණුම් හෝ මුදල් අත්තිකාරම් වවුචර කාඩ් හිමියා විසින් අත්සන් කර හෝ නොකර තිබියදී වුවද එසේ බැංකුව විසින් හර කරන ලද සියලුම මුදල් ගෙවීමට ප්‍රාථමික කාඩ් හිමියා සහ අතිරේක (Supplementary) කාඩ් හිමියා යන දෙදෙනාම සාමූහිකව හා තනි තනිව වගකිව යුතු වේ.

5.2 බැංකුව කාඩ් හිමියා වෙත ගිණුම් ප්‍රකාශනයක් එවන අතර එහි සඳහන් වන "ගෙවිය යුතු අවම මුදල" එහි ප්‍රකාශිත ගෙවීමට "නියමිත දිනය" වනවිට හෝ ඊට පෙර කාඩ් හිමියා විසින් බැංකුවට ගෙවිය යුතුය. එසේ වුවද ඔහුට තම අභිමතය පරිදි ගෙවිය යුතු මුළු මුදල හෝ ගෙවිය යුතු අවම මුදලට වැඩි ඕනෑම මුදලක් ගෙවිය හැක. ගෙවීම කළ යුතු අවසාන දිනය බැංකුවේ වැඩ නොකරන දිනයකට යෙදී ඇත්නම් ඊළඟට එළඹෙන වැඩ කරන දිනයේදී ගෙවීම කළ යුතුය.

5.3 මෙම ගිවිසුම කුමන අයුරකින් හෝ උල්ලංඝණය කිරීමේදී හෝ කාඩ් හිමියා විසින් කිසියම් බුන්වත් ක්‍රියාවක් සිදුකර ඇති විටෙක හෝ කාඩ් හිමියාගේ මරණය සිදු වූ විටෙක හෝ බැංකුවේ පූර්ණ අභිමතය පරිදි කිසියම් නීතියකින් පනවා ඇති සීමාවන්ට යටත්ව මෙම ගිවිසුම යටතේ ගෙවීමට ඇති සියලුම මුදල් වහාම ගෙවිය යුතු වේ.

5.4 බැංකුව වෙත කරන ලද ඕනෑම ගෙවීමක් බැංකුව විසින් දැනුම් දෙන ලද ලිපිනයට ලැබී කාඩ් ගිණුමට බැර කළ විට පමණක් බල සහිත වනු අතර ඇත. මෙම ගිවිසුම යටතේ කාඩ් හිමියාගේ බැඳීමක් අරහයා බැංකුව වෙත දෙන ලද ඕනෑම චෙක්පතක් ගෙවීමට ප්‍රමාණවත් මුදල් ගිණුමේ ඇති බවට ප්‍රාථමික කාඩ් හිමියා වගබලා ගත යුතුය.

6. ණය සීමාව

6.1 ණය සීමාව බැංකුව විසින් සිය පූර්ණ අභිමතය පරිදි තීරණය කර කාඩ් හිමියා වෙත ලිඛිතව දන්වනු ලැබේ. කලින් කලට ලිඛිත දැන්වීම් මගින් ණය සීමාව වැඩි කිරීමේ හෝ පහළ දැමීමේ අයිතියද බැංකුව විසින් රඳවාගනු ලැබේ. මුදල් හා මුදල් නොවන ගනුදෙනු (ඔබගේ කාඩ් ගිණුමේ මුළු ණය සීමාව තුළ) සඳහා බැංකුව විසින්ම වෙන වෙනම සීමාවන් පැනවිය හැකිය.

6.2 ඔබගේ කාඩ් ගිණුමේ ඉතිරිව ඇති ශේෂය වනුයේ එවකට අයවිය යුතු ශේෂය හා එදිනට සැකසීම සඳහා ලැබී නැති එහෙත් බැංකුව විසින් ඒ වන විටත් පිළිගෙන ඇති කාඩ් ගනුදෙනු සැළකිල්ලට ගැනීමෙන් පසු පාවිච්චි නොකරන ලද ණය සීමාව වේ. මුදල් හා මුදල් නොවන සීමාවන් පනවා ඇති කල්හි ඉතිරිව ඇති ශේෂයද ඒ අනුව වෙන් වේ. ඔබගේ කාඩ් ගිණුමේ ගනුදෙනු සැමවිටම ඉතිරිව ඇති මුදල් හා මුදල නොවන ශේෂය ඇතුළත සිදු කිරීමට ඔබ වගබලා ගත යුතුය.

6.3 කාඩ් හිමියා විසින් කාඩ් ගිණුමේ ණය සීමාව ඉක්මවා යාම ගිවිසුමේ නියමයන් හා කොන්දේසි උල්ලංඝණය කිරීමක් සේ සැළකෙන අතර බැංකුව සිය පූර්ණ අභිමතය පරිදි කලින් දැනුම් දීමක් නොකරම කාඩ් ගිණුම අවලංගු කරනු ඇත.

7. මුදල් අත්තිකාරම්

7.1 කාඩ් හිමියෙකුට ප්‍රමාණවත් ණය සීමාවක් ඉතිරිව ඇත්නම් විනිමය පාලන දෙපාර්තමේන්තුවේ රෙගුලාසි වලට යටත්ව හා කලින් කලට බැංකුවේ පූර්ණ අභිමතය මත බැංකුවට පිළිගත හැකි පරිදි ණය සීමාවේ උපරිම ප්‍රතිශතයක් දක්වා මුදල් අත්තිකාරම් පහත සඳහන් ආකාරයකින් ලබාගත හැකිය.

(අ) බැංකුවේ ඕනෑම ශාඛාවකට හෝ ඕනෑම සාමාජික ආයතනයකට කාඩ් හිමියාගේ හැඳුනුම් පිළිබඳ සාක්ෂි සමග කාඩ්පත ඉදිරිපත් කර අවශ්‍ය ගනුදෙනු වාර්තාව අත්සන් තැබීමෙන්.

(ආ) බැංකුවේ හෝ වෙනත් බැංකුවක් හෝ බැංකුව සමග තම ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍රය පාවිච්චිය සඳහා ගිවිසුමකට එළඹී ඇති ආයතනයක ATM යන්ත්‍රය පාවිච්චි කිරීමෙන්/වෙනත් ATM යන්ත්‍රයක් පාවිච්චි කිරීමේදී ලබාගත හැකි අත්තිකාරම අදාළ ATM යන්ත්‍රයෙන් වරකට ලබාගත හැකි උපරිම සීමාවට යටත් වේ.

7.2 මුදල් අත්තිකාරම් ලබාගැනීමේදී කලින් කලට පනවා ඇති ATM යන්ත්‍රය, බැංකුව, වෙළෙන්දා, නියෝජිතයා, දේශයේ හෝ විදේශයක ඇති පරිදි සීමාවන් විදේශ විනිමය රෙගුලාසි සහ/හෝ වෙනත් පාලන අධිකාරී පරි සීමාවන් අදාළ වනු ඇත.

7.3 ATM යන්ත්‍රයක් මගින් ගනුදෙනුවක් කිරීම සඳහා කාඩ්පත සමග සන්ධියව පාවිච්චි කිරීම සඳහා (PIN) රහස්‍ය අංකයක් සපයනු ඇත. කාඩ් හිමියා විසින් කුමන තත්ත්වයක් යටතේ වුවද තම රහස්‍ය අංකය වෙනත් කවර හෝ පුද්ගලයෙකුට හෙළිදරව් නොකළ යුතුය.

7.4 PIN අංකය හා සන්ධියව කරන ලද ඕනෑම කාඩ් ගනුදෙනුවක් පිළිබඳ බැංකුවේ වාර්තා පිළිගැනීමට කාඩ් හිමියා බැඳී සිටී.

7.5 කාඩ් හිමියා විසින් මුදල් අත්තිකාරමක් ලබාගැනීම සඳහා කාඩ්පත භාරගැනීම මගින් බැංකුව විසින් කලින් කලට නියම කරන පරිදි මුදල් අත්තිකාරම් ප්‍රමාණය මත මූල්‍ය ගාස්තුවක්, පොලියක් සහ ගාස්තුවක් ගෙවීමට එකඟත්වයක් සංස්ථාපනය කෙරේ. සෑම මුදල් අත්තිකාරමක්ම ලබාගත් දින සිට එය ගෙවා නිමවනතෙක් ඒ මත මූල්‍ය ගාස්තුවක් අය කෙරෙනු ඇත. කාඩ් හිමියා විසින් ගෙවිය යුතු මූල්‍ය ගාස්තු මුදල බැංකුව විසින් කලින් කලට වෙනස් කරනු ලැබිය හැක.

7.6 සංචාරක චෙක්පත්, ඉල්ලුම් අණකර, විදුලි පණිවුඩ මගින් මුදල් මාරු කිරීම වැනි පහසුවෙන්ම මුදල් කළ හැකි උපකරණ මිලදී ගැනීම්ද මුදල් අත්තිකාරම් සේ සැළකෙන අතර ඒවා ඉහතින් 7.5 යටතේ ඇති ගාස්තුවලට යටත් වනු ඇත.

7.7 කාඩ් හිමියා වෙත පූර්ව දැනුම් දීමක් නොකර වුවද මෙම පහසුකම ආපසු ගැනීමට බැංකුවට පුළුවන.

8. අතිරේක කාඩ්පත

8.1 බැංකුවට තම පූර්ණ අභිමතය පරිදි ප්‍රාථමික කාඩ් හිමියෙකු විසින් නම් කරන ලද ප්‍රාථමික කාඩ් හිමියා සහ අතිරේක කාඩ් හිමි/යා/යන් බද්ධව ඉල්ලුම් කරන අතිරේක කාඩ් පතක්/පත් අනුමත කර නිකුත් කරනු ඇත. අතිරේක කාඩ් හිමියා/හිමියන් වයස අවුරුදු 18ක් හෝ ඊට වැඩි හා ප්‍රාථමික කාඩ් හිමියාගේ ආසන්නම පවුලේ සාමාජිකයෙකු/සාමාජිකයන්, (කාළත්‍රයා, දරුවෙකු, දෙමව්පියන්, සහෝදරයෙකු/සහෝදරියක) විය යුතු අතර ප්‍රාථමික කාඩ් හිමියාගෙන් සෘජුවම යැපෙන ශිෂ්‍යයින් අධ්‍යාපනික අවශ්‍යතා සඳහා පමණක් අතිරේක කාඩ්පතකට හිමිකම් ලබන අතර මේ සියල්ලන්ම මෙම ගිවිසුමේ නියමයන් හා කොන්දේසිවලින් බැඳෙනු ඇත.

8.2 ප්‍රාථමික කාඩ් හිමියෙකුට පැවරෙන ණය සීමාවට අතිරේක කාඩ් හිමියාගේ ණය සීමාවද ඇතුළත් වන අතර එක් එක් අයගේ ණය සීමාවන් ඉක්මවමින් කාඩ්පත් භාවිතා කිරීමට ප්‍රාථමික කාඩ් හිමියා හා අතිරේක කාඩ් හිමියා විසින් ඉඩ නොතැබිය යුතුය.

8.3 අතිරේක කාඩ්පතෙහි වලංගුතාව, ප්‍රාථමික කාඩ්පතෙහි වලංගුතාව මත තීරණය වේ. කෙසේවෙතත්, අතිරේක කාඩ්පත සමාප්ත කිරීම, ප්‍රාථමික කාඩ්පත සමාප්ත වීමට හේතු නොවේ.

8.4 ප්‍රාථමික කාඩ් හිමියා අතිරේක කාඩ් හිමියා අතර එකිනෙකාට එරෙහිව ඇතිවන ඕනෑම මතභේදයක් හෝ ප්‍රතියාචනයක් මොනම අයුරකින්වත් ප්‍රාථමික කාඩ් හිමියාගේ සහ අතිරේක කාඩ් හිමියාගේ බැංකුවට ඇති ප්‍රතිඥා, වගකීම් හා බැඳීම් වලට හා බැංකුවේ අයිතිවාසිකම්වලට බලනොපානු ඇත.

8.5 ප්‍රාථමික කාඩ් හිමියා සහ අතිරේක කාඩ් හිමියා යන දෙදෙනාම ඔවුන්ගේ කාඩ් ගිණුම් බද්ධව හෝ වෙන වෙනම පවත්වාගෙන ගියත් ඔවුන්ගේ කාඩ් භාවිතා කරමින් කරන සියලුම ගනුදෙනු වෙන්වෙන්ව සමූහිකව හා වෙනවෙනම වගකිව යුතු වේ.

8.6 අතිරේක කාඩ්පත දෙකට කපා ලිඛිත දැන්වීමක් සමගින් බැංකුවට එවීමෙන් අතිරේක කාඩ් හිමියා/හිමියන්ට ඇති බලය ආපසු ලබාගැනීමට ප්‍රාථමික කාඩ් හිමියාට පුළුවන.

8.7 ඉහත 8.6 හි සඳහන් පරිදි බලය ආපසු ලබාගන්නා දිනයට පෙර අතිරේක කාඩ් හිමියා විසින් අනුමත කරන ලද සියලු කාඩ් ගනුදෙනු කාඩ් හිමියා වගකීමෙන් බැඳී සිටින වලංගු ගනුදෙනු වන අතර කාඩ් හිමියාගේ වගකීමක්ද වේ.

8.8 අතිරේක කාඩ් හිමියාගේ ඕනෑම නෛතික අබලතාවයක් හෝ අශක්නුතාවයක් හෝ අතිරේක කාඩ් හිමියා විසින් මෙම නියමයන් හේ කොන්දේසි ඕනෑම අයුරකින් කඩ කිරීමක් හේතුකොට ගෙන බැංකුවට සිදුවන නීතිමය හෝ වෙනත් ආකාරයක ඕනෑම අලාභයක්, හානියක්, පිරිවැයක් හා වියදමක් කාඩ් හිමියා විසින් හාණිපූරණය කළ යුතුය.

9. කාඩ්පත පිළිගැනීම

9.1 අදාළ පරිදි ප්‍රාථමික කාඩ් හිමියාගේ හෝ අතිරේක කාඩ් හිමියාගේ අත්සන සහිත නම් පමණක් කාඩ්පත පිළිගනු ලැබේ. (කාඩ්පතේ) නිෂ්පාදන සංකේතය ප්‍රදර්ශනය කරන වෙළෙඳ ආයතන සාමාන්‍යයෙන් කාඩ්පත පිළිගනී. කුමන හෝ හේතුවක් නිසා යම් වෙළෙන්දෙක්/මූල්‍ය ආයතනයක් විසින් කාඩ්පත පිළිගැනීම ප්‍රතික්ෂේප කිරීම පිළිබඳව බැංකුවට වගකීමක් හෝ බැඳීමක් නොමැත. ඕනෑම පරිශ්‍රයක කාඩ් ප්‍රවර්ධන පුවරු, පත්‍රිකා හෝ කාඩ් සංකේතය ප්‍රදර්ශනය කිරීම එම පරිශ්‍රයේ ඇති සියලු භාණ්ඩ හා සේවාවන් ඔබගේ කාඩ්පත භාවිතා කර මිලට ගැනීමට හැකි බවට ඇති තහවුරුයමක් (Warranty) නොවේ.

9.2 පෙට්‍රල් පිරවුම්හල් හා ගෑස් සපයන ආයතනවලින් පෙට්‍රල්, ඩීසල් සහ ගෑස් ආදිය මිලට ගැනීම් අදාළ කරගත හැකි පිරවුම් හා සේවා ගාස්තු වලට යටත් වේ.

9.3 කෙසේ වුවද කාඩ්පත ප්‍රතික්ෂේප කරන ඕනෑම වෙළෙන්දෙකු/බැංකුවක් පරීක්ෂණයකදී බැංකුවට ඉවහල් කර ගත හැකි ගනුදෙනුව කළ ස්ථානය, ගනුදෙනුවේ වේලාව, දිනය සහ අනෙකුත් තොරතුරුද සම බැංකුවට වාර්තා කිරීමට ඔබට පුළුවන.

10. ගිණුම් ප්‍රකාශනය

10.1 බැංකුව විසින් සෑම මසකම ඔබගේ කාඩ් ගිණුමේ ගනුදෙනු ඇතුළත් ප්‍රකාශනයක් කලින් නිශ්චය කරන ලද දිනයක සාමාන්‍ය තැපෑලෙන් ඔබ වෙත තැපැල් කරනු ඇත. ගෙවීමට ඇති ශේෂයක් නොමැති නම් හා පසුගිය ප්‍රකාශනයෙන් පසු ගිණුමට කාඩ් ගනුදෙනු ලැබී නොමැතිනම් ප්‍රකාශනයක් නිකුත් නොකරනු ඇත.

10.2 කුමන හෝ හේතුවක් නිසා ප්‍රකාශනයක් නොලැබීම අඩු වශයෙන් අවම හිඟ මුදලවත් නොගෙවීමට වලංගු හේතුවක් නොවේ. ඔබගේ සාමාන්‍ය ප්‍රකාශන දිනයේ සිට දින 10ක් ගත වී තිබියදීත් ප්‍රකාශනය නොලැබී ඇත්නම් ගෙවීමට ඇති මුදල පරීක්ෂා කිරීම සඳහා කරුණාකර බැංකුව (කාඩ් සේවා) අමතන්න.

10.3 පසුගිය ප්‍රකාශනය නිකුත් කළ දින සිට ප්‍රවර්තන ප්‍රකාශනයේ දිනය දක්වා කාලය තුළ ඔබගේ ගිණුමට ලැබුණු හා සකස් කරනු ලැබූ සියලු ගනුදෙනු විස්තර ඔබගේ ප්‍රකාශනයේ අඩංගු වේ.

10.4 ඔබගේ ප්‍රකාශනයේ ගෙවීමට ඇති මුදල් සැදුම්ලත් ආකාරය පහත සඳහන් පරිදි වේ.

(අ) ඔබ විසින් හෝ ඕනෑම අතිරේක කාඩ් හිමියන්/හිමියකු ඔබගේ කාඩ් ගිණුමේ හරට ඔබගේ කාඩ්පත පාවිච්චි කරමින් මිලට ගනු ලැබූ, සියලු තැපැල් මගින් හා දුරකථන මගින් කළ ඇණවුම්ද ඇතුලු සියලුම භාණ්ඩ හා සේවාවන්.

(ආ) ATM යන්ත්‍ර මගින් ලබාගත් සියලුම අත්තිකාරම්ද ඇතුලුව ඔබගේ කාඩ් ගිණුමෙන් ලබාගත් මුදල් අත්තිකාරම්.

(ඇ) මෙම ණයපත්වලට අදාළ නියමයන් හා කොන්දේසීන් වල **11 වන වගන්තිය (ගෙවීම් හා ගාස්තු)** යටතේ දක්වා ඇති ගාස්තු (උදා: ගාස්තු, සේවා ගාස්තු ආදිය) හා එවකට බලපවත්නා රජයේ බදු මුදල් හා ණයපත භාවිතා කිරීම නිසා උපචිත වූ පොලියද සමගින් අනිකුත් සියලුම බැංකු ගාස්තු.

11. ගෙවීම් සහ ගාස්තු

මෙම ඡේදයෙහි සඳහන් ප්‍රවර්තන ගාස්තුවල හා අය කිරීම්වල විස්තර (ඒ සඳහා ඉල්ලීමක් කිරීමෙන් පිටපතක්ද ලබා ගත හැකි) බැංකුව විසින් ප්‍රකාශයට පත් කරනු ලැබූ සේවාවන් සහ මිල පිළිබඳ මග පෙන්වීම් වල සඳහන් වේ. පූර්ව දැනුම් දීමකින් පසු මෙම ගාස්තු කලින් කලට සංශෝධනය කෙරෙනු ඇත.

11.1 කාඩ්පත සඳහා සහ අතිරේක කාඩ්පතක් නිකුත් කර ඇති විට ඒ සඳහා ද සම්බන්ධවීමේ ගාස්තුවක් හා වාර්ෂික ගාස්තුවක් (බැංකුව විසින් ඉල්ලා සිටි විට) බැංකුවට ගෙවීමට කාඩ් හිමියා එකඟ වේ. කාඩ්පත අවසාන කිරීමේදී හා භාර නොගත් විට වාර්ෂික ගාස්තුව ආපසු ගෙවීමක් නොකෙරේ.

11.2 ගිණුම් ප්‍රකාශනයේ නිශ්චිතව සඳහන් කර ඇති ප්‍රවර්තන ශේෂය ලෙස විස්තර කෙරෙන ගෙවීමට ඇති හා ගිණුම් ප්‍රකාශනයේ ගෙවිය යුතු දිනය ලෙස නිශ්චිතව දක්වා ඇති දිනයට පෙර ගෙවිය යුතු මුළු ගෙවීම් ප්‍රමාණය කාඩ් හිමියා විසින් බැංකුවට ගෙවිය යුතු අතර, ප්‍රවර්තන ශේෂය බැංකුවට ගෙවීම් කළ යුතු දිනයට හෝ ඊට පෙර ලැබී තිබේනම් කාඩ් හිමියාට (මුදල් අත්තිකාරමකදී හැර) මූල්‍ය ගාස්තුවක් ගෙවීමට සිදු නොවේ.

11.3 ගෙවීම් කළයුතු දිනයේ දී කාඩ්පත් හිමියා සම්පූර්ණ මුදල නොගෙවන්නේ නම්, ඒ මත බැංකුව විසින් තීරණය කරන අනුපාතයක් යටතේ පොලියක් අය කරනු ලැබේ. එය ගණනය කරන්නේ මාසික ප්‍රකාශනයේ සඳහන් ශේෂය මත දෛනිකව, මාසික ප්‍රකාශනය අදාළ වන මාසයේ පළමු වැනි දිනයේ සිට ඊළඟ මාසික ප්‍රකාශන දිනය දක්වා කාලය සඳහා ය. නමුත්, ඉහත කාලය අතරතුර ලැබෙන බිල්පත් වටිනාකම් මෙම පොලී ගණනය සඳහා යොදා නොගනී. නමුත් ඒ අතරතුර ඔබ විසින් කරන ගෙවීම් සැලකිල්ලට ගනු ලැබේ.

11.4 බැංකුව විසින් කලින් කලට නියම කරන පරිදි මාසික පොලියක් අය කරනු ලැබේ. පොලිය අය කරන සාමාන්‍ය ක්‍රියා පිළිවෙළ වනුයේ කාඩ්පතට ගෙවීමක් කරනු ලැබූ විට එම ගෙවීම ලද දිනට සම්පූර්ණ හර ශේෂය සඳහා පොලිය අය කිරීමයි. මේ අනුව සියලුම කොටස් වශයෙන් ගෙවීම්, එම ගෙවීම් ලද දිනය සම්පූර්ණ හර ශේෂය සඳහා පොලිය අය කිරීමය. මේ අනුව සියලුම කොටස් වශයෙන් ගෙවීම්, එම ගෙවීම ලද දිනට අයවිය යුතු මුළු මුදලේ ශේෂය සඳහා පොලිය අය කරගැනීමටද තවත් අයවීමට ශේෂයක් ප්‍රකාශනය නිකුත් කරන දිනට පවතී නම් එම දින දක්වා එකී අයවිය යුතු ශේෂය අයකර ගැනීමටද යෙද වේ.

11.5 ගිණුමක් විවෘත කිරීමෙන් පසු කාඩ් හිමියකුට ලැබෙන ප්‍රථම ප්‍රකාශනයෙහි ගිණුම විවෘත කළ දින සිට ප්‍රකාශනය නිකුත් කළ දින දක්වා සිදු කළ සියලු ගනුදෙනු හා ගෙවීමට ඇති ගාස්තු සඳහන් වේ. පොලී ගෙවීමකට යටත්වන මුදල් අත්තිකාරමක් ලබාගෙන ඇත්නම් මිස මෙම ප්‍රකාශනයේ පොලී අයකිරීමක් සඳහන් නොවනු ඇත. ගෙවීම නියමිත දිනට හෝ ඊට පෙර සම්පූර්ණ මුදල ගෙවා ඇත්නම් පොලියක් අය නොකරනු ඇත.

11.6 ගෙවීමට ඇති මුළු මුදලට අඩු එහෙත් ගෙවිය යුතු අවම මුදල හෝ ඊට වැඩි මුදලක් ගෙවූ විට පොලියක් අය කරනු ලැබේ. එසේ අය කරන පොලිය ඊළඟට නිකුත් කරන ප්‍රකාශනයෙහි සඳහන් කෙරේ. නමුත් ඊළඟ ප්‍රකාශන දිනය දක්වා තුළ කෙරෙන ගනුදෙනු වෙනුවෙන් (මුදල් අත්තිකාරම් සඳහා හැර) ඒ අවස්ථාවේදී පොලියක් අය කරනු නොලැබේ.

11.7 මේ අනුව ගිණුම් ප්‍රකාශනයෙහි සඳහන් වන මුළු මුදල ගෙවන කාඩ් හිමියෙකු ඔහුගේ ගනුදෙනු (මුදල් අත්තිකාරම් හැර) වෙනුවෙන් පොලියක් ගෙවීමෙන් නිදහස් වේ.

11.8 මුදල් අත්තිකාරමක් සඳහා පොලිය අය කරනු ලබන්නේ මුදල් ආපසු ලබාගත් දිනයේ සිට එම මුදල් සම්පූර්ණයෙන්ම ආපසු ගෙවූ දින දක්වා පමණකි.

11.9 ගෙවිය යුතු අවම මුදල නියමිත දිනට නොගෙවුයේ නම් එම පොලියට අමතරව කලින් කලට බල පැවැත්වෙන ප්‍රමාද ගෙවීම් ගාස්තුවක් ගෙවීමට කාඩ් හිමියා වගකීමෙන් බැඳේ.

11.10 බැංකුව විසින් කලින් කලට නියම කරන අනුපාතයන්ට අනුව පහත සඳහන් ගාස්තු හා ගෙවීම් බැංකුවට ගෙවීමට කාඩ් හිමියා එකඟ වේ.

11.11 ගෙවීමට නියමිත දිනට ප්‍රවර්ථන ශේෂය කාඩ් හිමියා නොගෙවන්නේ නම් කාඩ් ගිණුමට ගෙවීම් බැර කරනතෙක් දෛනික ශේෂය මතද හා ඉනික්බිතිව අඩුවන ශේෂය මතද ගණනය කරනු ලබන මූල්‍ය ගාස්තුවක් පනවනු ඇත.

11.12 කාඩ් හිමියා වෙතින් බැංකුවට ලැබෙන සියලුම ගෙවීම් පහත සඳහන් පිළිවෙලට හෝ බැංකුව විසින් සුදුසු යැයි අදහස් කරන ප්‍රමුඛතා පිළිවෙලකට අනුව යොදවනු ඇත.

11.12.1 සියලුම නොගෙවන ලද මූල්‍ය සේවා ගාස්තු මූල්‍ය අත්තිකාරම් හා ඊට පෙර ගිණුම් ප්‍රකාශනවලින් පෙන්නුම් කරන ලද අනෙක් පිරිවැය.

11.12.2 සියලුම නොගෙවන ලද මූල්‍ය ගාස්තු, සේවා ගාස්තු, අයකිරීම් මුදල් අත්තිකාරම් සහ ප්‍රවර්ථන ගිණුම් ප්‍රකාශනයේ පෙන්නුම් කරන අනෙක් පිරිවැය.

11.12.3 සියලුම නොගෙවන ලද කාඩ් ගනුදෙනු හා ඊට පෙර ගිණුම් ප්‍රකාශවලින් පෙන්නුම් කරන ලද මිලදී ගැනීමේ ගනුදෙනු.

11.12.4 සියලුම නොගෙවන ලද කාඩ් ගනුදෙනු සහා ප්‍රවර්ථන ගිණුම් ප්‍රකාශනයේ පෙන්නුම් කරන ලද මිලදී ගැනීමේ ගනුදෙනු.

11.12.5 සියලුම මූල්‍ය ගාස්තු, සේවා ගාස්තු, වියදම්, මුදල් අත්තිකාරම්, අනෙකුත් පිරිවැය හා ඒ වනවිටත් ප්‍රවර්ථන ගිණුම් ප්‍රකාශයේ පෙන්නුම් නොකෙරෙන කාඩ් ගනුදෙනු.

11.13 වාර්ෂික ගාස්තු, හැසිරවීම් ගාස්තු, අතිරේක ගාස්තු, මූල්‍ය ගාස්තු, නිශ්චිත ගෙවිය යුතු අවම මුදල, සහ/හෝ ප්‍රමාද ගෙවීම් ගාස්තු හෝ වෙනත් ගාස්තු, ගණනය කිරීමේ අනුපාතය හෝ ක්‍රමය වෙනස් කිරීමේ තනි අභිමතය බැංකුව සතු වේ.

11.14 ආදේශ කාඩ්පත් නිකුත් කරන ලෙස බැංකුවෙන් ඉල්ලීමක් කළ වහාම කාඩ් හිමියා විසින් බැංකුවට නියම කරනු ලබන ආදේශ ගාස්තුවක් ගෙවිය යුතුය. විකුණුම් වවුචර මුදල් අත්තිකාරම් පත්‍රිකා හා බැංකුව විසින් වරින් වර වැඩිමනත් සේවාවන් හි පිටපතක් ලබා දෙන ලෙස බැංකුවෙන් ඉල්ලීමක් කළ වහාම බැංකුව විසින් නියම කරන ලබන අතිරේක ගාස්තුවක් කාඩ් හිමියා විසින් බැංකුවට ගෙවිය යුතුය.

11.15 ගෙවිය යුතු මුදලක පූර්ණ ගෙවීමක් හෝ භාගික ගෙවීමක් අය කර ගැනීම සඳහා කාඩ් හිමියා විසින් නිකුත් කරන ලදුව අගරු කරනු ලැබූ චෙක්පත් සඳහා, ඒ වෙනුවෙන් ඕනෑම අවස්ථාවක සුදුසු නීති කෘත්‍යයක් සඳහා බැංකුවට ඇති අයිතියට අගතියක් නොවන අයුරින්, බැංකුව විසින් ගාස්තුවක් අය කළ හැකිය.

11.16 කාඩ් ගිණුම යටතේ කුමන හෝ මුදලක් කාඩ් හිමියාගෙන් බැංකුවට අයවීමට ඇත්නම් හෝ කාඩ් හිමියා ඕනෑම ආකාරයකින් බැංකුවට හෝ ඕනෑම ගිණුමකට හෝ ජංගම හෝ වෙනත් ඕනෑම ගිණුමකට වගකිව යුතු නම් හෝ කාඩ් හිමියාට ඒකී ගිණුම්වල ප්‍රතිපාදන වලදී හෝ බැංකුව විසින් සපයන ලද බැංකු පහසුකම් ගෙවීම පැහැර හැරීමක් කර ඇත්නම් එවිට හා එබඳු අවස්ථාවකදී කාඩ් හිමියාගේ ගිණුමේ අයවිය යුතු මුළු ශේෂයම වහාම හිඟ වූ හා අයවිය යුතු මුදලක් බවට පත්වන බවට හා 17 වන වගන්තියේ (ගිණුම අවසාන කිරීම) මෙහිදී අදාළ කරගත හැකි බවට කාඩ් හිමියා මෙයින් ප්‍රකාශිතව එකඟ වේ.

11.17 ඔබගේ කාඩ් ගිණුමේ ශේෂය දන්වමින් බැංකුවේ නිලධාරියෙකු විසින් අත්සන් කරන ලද සහතිකයක් එම සහතිකයේ දිනට බැංකුවට ඔබගේ ඇති වගකීම පිළිබඳ බැලූ බැල්මට පිළිගත හැකි සාක්ෂියක් වේ.

11.18 මුදල් තැන්පතුවක් බැංකුවට ලැබුණු බවට සැළකෙන්නේ එම මුදල කාඩ් ගිණුමට බැර කිරීමත් සමගය.

11.19 චෙක් තැන්පතු රැස් කිරීම සඳහා භාරගන්නා අතර එම චෙක්පත් නිෂ්කාශණය වී බැංකුවෙන් මුදල් ලැබෙන තුරු කාඩ් ගිණුමට චෙක්පත්වල සඳහන් මුදල් එකතු නොකෙරේ. අපගේ ATM යන්ත්‍ර සහ චෙක්පත් තැන්පතු පෙට්ටි මගින් බැංකුගත කළ චෙක්පත්, ඊළඟ වැඩකරන දිනයේ දී රැස් කරනු ලැබේ.

11.20 බැංකුවේ ශාඛාවක් නොමැති ස්ථානවල ඇති බැංකුවලට අණ ලද චෙක්පත් මගින් කරන ගෙවීම් බැංකුව විසින් කලින් කලට නියම කරන ලද සකස් කිරීමේ සහ හැසිරවීමේ ගාස්තුවකට යටත් වේ.

11.21 කාඩ් හිමියන්ගේ කාඩ්පත් සඳහා ගෙවිය යුතු හිඟ මුදලින්, එක්තරා ප්‍රතිශතයක් කිසියම් නිශ්චිත දිනයකදී අය කර ගැනීම සඳහා කාඩ් හිමියාගේ බැංකුව සමග ඇති ජංගම හෝ ඉතුරුම් ගිණුම කෙලින්ම හර කිරීම සඳහා නිත්‍ය නියෝගයක් නිකුත් කළ හැක. එවැනි නිත්‍ය නියෝගයක් සංශෝධනය හෝ අවලංගු කිරීමකදී එම නිවේදනය ඊළඟ ගෙවීම කළ යුතු දිනයට යටත්පිරිසෙයින් සති දෙකකටවත් පෙර බැංකුවට ලැබිය යුතුය.

11.22 කලින් කලට බැංකුව විසින් සුදුසු යැයි අදහස් කරන අන්දමට, මෙම නීති-රීති හා කොන්දේසි යටතේ කාඩ් හිමියාගේ බැංකුවට ඇති වගකීම් ගෙවා දැමීම සඳහා කාඩ් ගිණුම හා අදාළව කාඩ් හිමියා බැංකුවට ගෙවන මුදල්, බැංකුව විසින් යොදා ගනු ඇත.

11.23 ගෙවීම් කරන ලද සේ සැළකෙන්නේ, සාමාන්‍ය වැඩ කරන ක්‍රියාපටිපාටිය පරිදි ගෙවීම් සත්‍ය වශයෙන්ම බැංකුවට ලැබුන දින සිට මිස ප්‍රකාශනය තැපැල් කරන දිනයේ සිට නොවේ. කාඩ් ගිණුමට ගෙවීමක් බැරවීම සඳහා අඩුම වශයෙන් දින 3ක් හෝ 4ක කාලයක් ඉඩදිය යුතුය.

11.24 කාඩ් හිමියකු කරන සියලුම ගෙවීම් කාඩ් ගිණුමක බිල් කරන (Billing Currency) මුදල් වර්ගයෙන් කළ යුතු අතර කාඩ් හිමියා විසින් සියලු විනිමය කොමිස් සහ අනිකුත් ගාස්තු හා බැංකුව විසින් එවැනි ගෙවීම් බිල් කරන මුදල් වර්ගයට අපවර්තනය කිරීමේදී බැංකුවට දරන්නට සිදුවූ පාඩු හෝ ගාස්තුද බැංකුවට ගෙවිය යුතුය. එබඳු අපවර්තන ක්‍රියාත්මක වන්නේ කාඩ් ගිණුමට ප්‍රවේශනය කරනු ලබන දිනට බැංකුව විසින් තීරණාත්මකව නියම කරනු ලැබූ යම් විනිමය අනුපාතිකයකට අනුවය. කාඩ් හිමියා විසින් කාඩ් ගිණුමට බිල් කරන මුදල් වර්ගයෙන් කරනු ලබන ඕනෑම ගෙවීමක් කාඩ් ගිණුමට බැර කරනුයේ බැංකුව විසින් අරමුදල් ප්‍රවේශනය කරන දිනට වන අතර, බිල් කරන මුදල් වර්ගය හැර වෙනත් ඕනෑම මුදල් වර්ගයකින් ගෙවීමක් ලද කල්හි එම ගෙවීම බැර කරනුයේ එය බිල් කරන මුදල් වර්ගයට අපවර්තනය කළ දිනට පසුව හෝ අදාළ මුදලේ වටිනාකම බැංකුවට ලැබී කාඩ් ගිණුමට ප්‍රවේශනය කළ පසුවය.

11.25 ගිණුම් ප්‍රකාශනය නොලැබීම, කාඩ් හිමියා විසින් ගෙවිය යුතු මුදල් නිසි කලට නොගෙවා සිටීමට තරම් ප්‍රමාණවත් හේතුවක් ලෙස සැළකිය යුතු නොවේ. බැංකුවේ පාලනයට පරිබාහිර වූ සහ පූර්වේක්ෂණය නොවූ අවස්ථාවන් නිසා ගිණුම් ප්‍රකාශනය නොලැබී යාමකදී බැංකුවට වගකීමක් නොපැවරේ.

11.26 කාඩ් හිමියා සංචාරයක යෙදී සිටියදී හෝ නගරයේ නොසිටින විටෙක යටත්පිරිසෙයින් ගෙවිය යුතු අවම මුදල ගෙවීමට නියමිත දින හෝ ඊට පෙර ගෙවන බවට වග බලා ගැනීම කාඩ් හිමියා සතුය.

11.27 සිදු කරන ලද ගනුදෙනුවක මුදල් ආපසු ලබාදීමේදී බැංකුව විසින් කාඩ් හිමියාගේ ගිණුම බැර කරනුයේ සාමාජික ආයතනය විසින් ඒ පිළිබඳව නිසි පරිදි නිකුත් කරන ලද බැර වවුචරයක් බැංකුවට ලැබීමෙන් පසුවය.

11.28 ඕනෑම ගිණුම් ප්‍රකාශනයක සඳහන් මුදලක් කාඩ් හිමියා විසින් බැංකුවට ගෙවීම, ඔහු එම ගිණුම් ප්‍රකාශනයෙහි අඩංගු ප්‍රවේශනයන් පිළිගත් බවට බැඳී සිටින තීරණාත්මක සාක්ෂියක් වේ. කාඩ්පතට අදාළ වන ඉහත ලැයිස්තුගත කර නොමැති මූල්‍ය ගාස්තු හා අනිකුත් ගාස්තු පිළිබඳව සහ කඩ්පතෙහි භාවිතය පිළිබඳ වැඩිමනත් විස්තර කාඩ් සේවා අංශය අමතා ලබා ගත හැක.

12. ව්‍යවස්ථාපිත රෙගුලාසි

12.1 කලින් කලට ශ්‍රී ලංකා මහ බැංකුව හෝ ඒ හා සමාන නියාමන අධිකාරියක් විසින් පනවනු ලබන සියලුම රෙගුලාසි අනුගමනය කිරීමටද කාඩ් පතක් පාවිච්චි කිරීම හේතුකොටගෙන බැංකුවට සිදු විය හැකි ඕනෑම අලාභයක්, යාචනයක් හෝ වියදමක් බල පවත්නා යම් රෙගුලාසියක් නොපිළිපැදීම හෝ උල්ලංඝණය කිරීම නිසා සිදු වී ඇති විටෙක ඒ වෙනුවෙන් හානිපූරණය කිරීමටද කාඩ් හිමියා එකඟ වේ.

12.2 කාඩ් හිමියා තම කාඩ්පත ප්‍රාග්ධන ගනුදෙනු හා පාරිභෝගික භාණ්ඩ වාණිජමය ප්‍රමාණයන්ගෙන් මිලදී ගැනීම/ආනයනය කිරීම සඳහා පාවිච්චි නොකළ යුතුය.

12.3 මෙම කාඩ්පත භාවිතය මගින් විද්‍යුත් අරමුදල් මාරු කිරීම (EFT) හෝ විදේශයක ATM යන්ත්‍ර ක්‍රියාත්මක කිරීමේදී ඒ ගනුදෙනු අවසරලත් කරුණු සඳහා පමණක් කළ යුතු අතර කලින් කලට විදේශ විනිමය දෙපාර්තමේන්තුව විසින් නිකුත් කර ඇති රෙගුලාසිවලට එම ගනුදෙනු යටත් වේ.

12.4 කාඩ් හිමියා විදේශයකට සංක්‍රමණය වීමේදී හෝ කලින් කලට බල පවත්නා විනිමය පාලන රෙගුලාසි වල අර්ථ නිරූපනය වන "අනේවාසික" තත්ත්වයට පත් වීමේදී තම කාඩ්පත බැංකුවට භාරදිය යුතුය.

12.5 බැංකුව කලින් කලට විනිමය පාලන හෝ වෙනත් ඕනෑම නියාමන අධිකාරීන් විසින් දක්වා ඇති (සම්ප්‍රතිඥාන) අවශ්‍යතාවයන්ට අනුකූලව කටයුතු කරන අතර ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ බල පවත්නා නීති හා රෙගුලාසි ප්‍රකාර අදාළ අධිකාරීන් වෙත කාඩ් ගනුදෙනු පිළිබඳවද හෙළිදරව් කළ හැකිය.

12.6 අවලංගු කරන අවස්ථාවේදී බලපැවැත්වෙන විනිමය පාලන රෙගුලාසි හෝ වෙනත් ඕනෑම ව්‍යාවස්ථාපිත රෙගුලාසියක් කඩ කර ඇති බවට බැංකුවට විශ්වාස කිරීමට ඉවහල් වන කවර හෝ හේතුවක් ඇති විටෙක කාඩ් හිමියාට/හිමියන්ට පූර්ව දැනුම්දීමකින් තොරව ඒකමතිකව කාඩ්පතක් අවලංගු කිරීමට බැංකුවට පුළුවන.

13. අයකර ගැනීම

බැංකුවට ඕනෑම අවස්ථාවක දැනුම් දීමකින් හෝ වගකීමකට බැඳීමෙන් තොරව බැංකුවේ කාඩ් හිමියා/හිමියන් නමින් ඇති ගිණුමක/ගිණුම්වල බැරට ඇති ඕනෑම මුදලක් කාඩ් ගිණුම වෙනුවෙන් බැංකුවට අයවීමට හිඟව ඇති මුදලක් පියවීම සඳහා හිලව් කරගැනීමට/හෝ මාරු කිරීමට පුළුවන.

14. කාඩ්පතක වලංගු භාවය, කල් ඉකුත් වීම හා අලුත් කිරීම

14.1 සියලුම කාඩ්පත් සාමාන්‍යයෙන් නිකුත් කරනු ලබන්නේ වර්ෂයක වලංගු කාලයක් සඳහා වේ. බැංකුවට තම අභිමතය පරිදි එක් වර්ෂයක් ඉක්මවන වලංගු කාලයක් සඳහාද කාඩ්පත් නිකුත් කළ හැකිය. කාඩ්පතක වලංගුභාවය අවසාන වන්නේ ඔබගේ කාඩ්පතෙහි සඳහන් කල් ඉකුත් වන දිනටය.

14.2 මෙහි සඳහන් නියමයන් හා කොන්දේසි කඩකිරීමක් සිදුවී නොමැතිනම් බැංකුව ඔබගේ (හා ඔබගේ අතිරේක කාඩ් හිමියන්ගේ) කාඩ්පතෙහි/පත්වල වලංගු භාවය එහි/ඒවායේ සඳහන් කර ඇති කල් ඉකුත් වන දිනයට දින 15 කට පෙර ස්වයංක්‍රීයව අලුත් කර නව කාඩ්පතක්/පත් ඔබට එවනු ඇත. මෙම නියමිත කාලය තුළ ඔබගේ අලුත් කරන ලද කාඩ්පත/පත් නොලැබුනහොත් කරුණාකර බැංකුවේ කාඩ් සේවා අංශය වෙත දන්වන්න.

14.3 මාසයක් හෝ ඊට වැඩි කාලයක් මුළුල්ලේ ගෙවීම් ලැබීමට නොමැති සියලු කාඩ්පත් ස්වයංක්‍රීයව අලුත් කරනු ලැබේ. යම් කාඩ් හිමියෙකුට තම කාඩ්පත හෝ අතිරේක කාඩ්පත අලුත් කිරීමට අවශ්‍ය නැත්නම් ඒ බවට ලිඛිත දැන්වීමක් මාස දෙකකට පෙරාතුව කාඩ් සේවා අංශයට එවිය යුතුය. කල් ඉකුත්වන දිනට එවනු ලබන දැන්වීම් භාරගනු නොලැබේ. නියමිත පරිදි දැන්වීමක් නොලද විට අලුත් කිරීමේ ගාස්තුව (ඒ වනවිට ගෙවීමට නියමිත) අය කරන අතර එය ආපසු ගෙවනු නොලැබේ.

14.4 කාඩ් හිමියකු විසින් තම කාඩ්පත එහි වලංගු කාලයෙන් බැහැරව පාවිච්චි නොකළ යුතුය. කාඩ්පතක් එහි වලංගු කාලයෙන් බැහැරව පාවිච්චි කිරීම නිසා සිදුවිය හැකි ප්‍රතිවිපාකයන්ට බැංකුව කුමන හේතුවක් නිසා හෝ වග කියනු නොලැබේ.

15. කාඩ් හිමියා හා වෙළෙන්දන් අතර ඇතිවන ආරාවුල්

15.1 ඕනෑම වෙළඳ ආයතනයකට/මූල්‍ය ආයතනයකට එරෙහි ආරාවුලක් හෝ පැමිණිල්ලක් කාඩ් හිමියා විසින් වෙළෙන්දා සමග සෘජුව විසඳා ගත යුතුය. ඔබ හෝ අතිරේක/අමතර කාඩ් හිමියකු ඕනෑම වෙළෙන්දෙකු/මූල්‍ය ආයතනයක් වෙතින් ලබාගත් භාණ්ඩ හෝ සේවාවන්හි ගුණාත්මක භාවය පිළිබඳව කුමන අයුරකින් වත් බැංකුව වග නොකියයි.

16. ආරාවුල් හා විසඳුම්

16.1 ගිණුම් ප්‍රකාශනයෙහි යම් වරදක් සිදුවී ඇතැයි කාඩ් හිමියා විශ්වාස කරන්නේ නම් ඔහු වහාම (අඩුම වශයෙන් ප්‍රකාශනයේ සඳහන් දිනයට දින 30ක් ඉක්මවීමට පෙර) බැංකුවට දන්වා තිබිය යුතුය. ඒ පිළිබඳව බැංකුව විසින් කරනු ලබන විමර්ශනයන්හිදී සහාය කරගනු පිණිස නම සහ කාඩ් අංකය ප්‍රකාශන ගනුදෙනුව පිළිබඳ විස්තර සහ වරදක් වූ බවට සැක කෙරෙන ගනුදෙනුවේ මුදල යන තොරතුරු කාඩ් හිමියා විසින් සැපයීම අවශ්‍ය කෙරේ.

16.2 කාඩ් හිමියා බැංකුවට වාචිකව දන්වන්නේ නම් ඔහුගේ පැමිණිල්ල වැඩ කරන දින 5ක් ඇතුළත ලිඛිතවද එවීම අවශ්‍ය වේ. ඒ පිළිබඳව වැඩිමනත් තොරතුරු අවශ්‍ය වන අවස්ථාවලදී බැංකුව කාඩ් හිමියාව අමතනු ඇත.

16.3 බැංකුවේ විමර්ශණය හා නිවැරදි කිරීම (අවශ්‍ය වේ නම්) සිදු කරන තුරු බැංකුවට තම තනි අභිමතය පරිදි ආරවුල විසඳන තෙක් ඊට මුල් වූ ගනුදෙනුවේ මුදල ඔබගේ ගිණුමට බැර කළ යුතුය. විමර්ශනයෙන් නිමවූ පසු, වරදක් සිදු වී නැති බවට බැංකුව නිගමනය කළහොත් ඒ බව බැංකුව විසින් කාඩ් හිමියාට ඉඳුරාම දන්වනු ඇත. කාඩ් හිමියාගේ ගිණුම ආරවුලට මුල් වූ ගනුදෙනු මුදලේ වටිනාකමට හර කෙරෙන අතර ඒ හා අදාළව සේවා ගාස්තුවක්ද උපචිත වන අතර කාඩ් හිමියාගේ විමසීම විමර්ශනය කිරීමේදී බැංකුවට තම පැරණි වාර්තා අතුරින් හෝ වෙනත් බැංකුවක් හරහා පැරණි වවුචර පිටපත් ආදිය ලබාගැනීමට සිදු වී නම් සුදුසු පරිදි වාර්තා ලබාගැනීමේ ගාස්තුවක් ද කාඩ් හිමියාගේ ගිණුමට හර කෙරෙනු ඇත.

17. කාඩ්පත සමාප්ත කිරීම

17.1 ඉහත **11 වන වගන්තියේ (ගෙවීම් හා ගාස්තු)** විස්තර කර ඇති ගෙවීම් ප්‍රතිපාදන කුමක් වුවද කාඩ්පතක (සියලුම අතිරේක කාඩ්පත්ද ඇතුලුව) ගෙවීමට ඇති සියලුම මුදල් ඒ වනවිටත් කාඩ්පත භවිතා කර සිදු කළ එහෙත් කාඩ් ගිණුමට හර නොවූ ගනුදෙනුවල වටිනාකමද සමගින් ගෙවීමට නියමිත සේ සැළකෙන අතර කාඩ්පතක් සමාජන කිරීමේ වහාම ආපසු ගෙවිය යුතු වේ. මෙම ගිවිසුම (අවසාන) සමාප්ත කිරීම කාඩ් හිමියා විසින් දෙනු ලබන ලිඛිත දැන්වීමක් සමග කාඩ්පත/පත් දෙකට කපා භාරදීමෙන් හෝ කාඩ් හිමියාගේ මරණය, බුන්වත් බව හෝ පරීක්ෂණභාවය හෝ බැංකුවේ වගකීමට යටත් නොවන හේතූන් මත කාඩ් හිමියාගේ පදිංචිය පිළිබඳ තොරතුරු බැංකුවට නොමැති විට සිදු විය හැකිය. කාඩ් ගිණුමේ ගෙවීමට ඇති ශේෂය මුළුමනින්ම ආපසු ගෙවීමට කාඩ් හිමියා සහ/හෝ ඔහුගේ බූදලය වගකිව යුතු අතර එසේ ගෙවීමට ඇති ශේෂයන් අය කරගැනීමේදී බැංකුවට දැරීමට සිදුවන (නීති ගාස්තු හා වියදම් ඇතුලු) සියලුම පිරිවැය භාණ්ඩපූරණය කිරීමටද සිදු වේ. එබඳු ආපසු ගෙවීමක් ලැබෙනතුරු පවත්නා අනුපාතයන් යටතේ පොලී සහ අනිකුත් ගාස්තු අය කර ගැනීමට බැංකුවට බලය ලැබී ඇත.

17.2 ප්‍රාථමික කාඩ් හිමියා කාඩ් පත සමාප්ත කරන අවස්ථාවකදී එම ප්‍රාථමික කාඩ් හිමියා සහ අතිරේක කාඩ් හිමියන්ද ඇතුලුව සියලුම කාඩ් හිමියන් මෙම නියමයන් හා කොන්දේසි වලට අනුව ගෙවීමට ඇති සියලුම මුදල් පියවා දමනතුරු හා සියලුම කාඩ් පත් දෙකට කපා බැංකුවට ආපසු එවන තුරු සාමූහිකව හා වෙන්වෙන්ව බැංකුවට වගකිව යුතුය.

17.3 බැංකුව පූර්ව දැනුම් දීමක් කර හෝ නොකර හේතුවක් ඇතිව හෝ නැතිව කාඩ් පත අවලංගු කිරීම මගින් හෝ එය අලුත් කිරීම ප්‍රතික්ෂේප කිරීම මගින් මෙම ගිවිසුම ඕනෑම වේලාවක සමාප්ත කරනු ලැබිය හැකිය.

17.4 කාඩ් ගිණුම සමාප්ත කිරීමේදී වාර්ෂික සාමාජික ගාස්තුව හෝ ඉන් කොටසක් හෝ ආපසු ගෙවීමට බැංකුව බැඳී නොසිටී.

17.5 කාඩ් පත නිකුත් කිරීම වෙනුවෙන් ඇපයක් වශයෙන් බැංකුව විසින් යම් සුරැකුමක් තබාගෙන ඇතිනම් ගෙවීමට ඇති සියලුම මුදල් පියවීමෙන් පසුව වුවද කාඩ්පත බැංකුව විසින් හෝ කාඩ් හිමියා විසින් අවලංගු කිරීමේ හෝ ගිවිසුම සමාප්ත කිරීමේ දින සිට දින 45ක් ගෙවෙන තෙක් එකී සුරැකුම රඳවා තබාගැනීමේ අයිතිය බැංකුව සතු වේ.

17.6 දෙපාර්ශ්වයෙන් කවර පාර්ශ්වයක් විසින් මෙම ගිවිසුම සමාප්ත කළත්, කාඩ්පත පාවිච්චි කිරීම හේතුවෙන් දැරීමට සිදුවන සියලුම වැඩිතර ගාස්තු ගෙවීමට කාඩ් හිමියා තවදුරටත් වගකිව යුතුය.

18. වගකීම බැහැර කිරීම

පහත සඳහන් ක්‍රියා හෝ සිදුවීම් හේතු කොට ගෙන සෘජුව හෝ වක්‍රව පැන නගින කුමන හෝ අලාභයක් හෝ හානියක් පිළිබඳව බැංකුව කාඩ් හිමියාට මොනම අයුරකින් හෝ වගකීමක් නොදරයි.

18.1 බැංකුව හෝ වෙළෙන්දෙක් හෝ වෙනත් බැංකුවක් හෝ මූල්‍ය ආයතනයක් හෝ ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍රයක් (ATM) හෝ වෙනත් පාර්ශ්වයක් විසින් කාඩ් ගනුදෙනුවක් ප්‍රතික්ෂේප කිරීම හෝ ණය සීමාව දක්වා හෝ මුළුමනින්ම මුදල් අත්තිකාරමක් ලබා දීම හෝ ප්‍රතික්ෂේප කිරීම නිසා කුමන අයුරකින් හෝ පැන නගින ලද හෝ සිදුවන ඕනෑම අලාභයක් හෝ හානියක්.

18.2 ඕනෑම වෙළඳ හෝ ගෙවීම් කරන සංවිධානයකට අයත් සාමාජික ආයතනයක් විසින් කාඩ්පත ගරු කිරීමට හෝ භාර ගැනීමට ප්‍රතික්ෂේප කිරීම හෝ ඕනෑම වෙළෙන්දෙක් සැපයූ භාණ්ඩ හෝ සේවාවන්හි අඩුපාඩුවක් හෝ අදාළ වන අවස්ථාවන්හිදී වෙළෙන්දෙකු විසින් කාඩ් ගනුදෙනුවක් සිඳ දැමීම හෝ ක්‍රියාත්මක නොකිරීම.

18.3 ATM යන්ත්‍රයක හෝ POS උපකරණයක ක්‍රියාකාරිත්වයේ වරදක් හෝ අදාළ සංනිවේදන පද්ධතිවල බාධාවක් හෝ අක්‍රීය වීමක්.

18.4 කාඩ්පතක් එහි (එම්බොස්) මුද්‍රණය කරන ලද කල් පිරෙන දිනයට පෙර බැංකුව විසින් හෝ වෙනත් පුද්ගලයෙකු විසින් හෝ ATM යන්ත්‍රයක් හෝ POS උපකරණයක් යන කුමක් හෝ විසින් කාඩ්පතක් ඉල්ලීමක් හෝ ආපසු භාර දීමක් කරන ලෙස විධානයක් කිරීමට සහ/හෝ අත්පත් කර ගැනීමක් සඳහා ඇති අයිතිය ක්‍රියාත්මක කිරීම.

18.5 17 වගන්තිය (සමාප්ත කිරීම) පරිදි බැංකුවට ඕනෑම කාඩ්පතක් හෝ කාඩ් ගිණුමක් සමාප්ත කිරීම සඳහා ඇති අයිතිය ක්‍රියාත්මක කිරීම.

18.6 කාඩ්පතක් නැවත අත්පත් කර ගැනීම, එය ආපසු භාර දෙන ලෙස ඉල්ලා සිටීම හෝ ඕනෑම අයෙකු විසින් එය ගරු නොකිරීම නිසා කාඩ් හිමියෙකුගේ ණය යෝග්‍යතාවයට හෝ තත්ත්වයට හානියක් සිදුවීම.

18.7 20 වැනි වගන්තිය (බැංකුවේ පොත්පත්, වාර්තා සහ ගනුදෙනුකාර තොරතුරු) ප්‍රකාර බැංකුව විසින් හෙළිදරව් කරන ලද විස්තර වල අඩංගු ඕනෑම ප්‍රකාශන හෝ නියෝජන දෝෂයක්, වැරදීමක් හෝ අතපසුවීමක් (omission) සිදුවීම.

18.8 කාඩ් හිමියා සහ ඕනෑම වෙළෙඳ ආයතනයක් හෝ බැංකුවක් හෝ මූල්‍ය ආයතනයක් හෝ වෙනත් ඕනෑම පුද්ගලයෙක් අතර ආරවුලකදී, එම ආරවුල යටතේ කාඩ් හිමියා විසින් එකී වෙළෙඳ ආයතනයට හෝ බැංකුවට හෝ මූල්‍ය ආයතනයට හෝ පුද්ගලයාට එරෙහිව ගැනීමට ඉඩ ඇති ප්‍රති ඉල්ලීමක්, හිලව් කිරීමේ අයිතියක් විසින් කුමන ආකාරයකින් වත් බැංකුවට බලපෑමක් නොකළ යුතුය.

18.9 ස්වභාවික හේතූන්, කලකෝලාහල, මහජන කැළඹිලි, (Insurrections) කැරලි, යුද්ධ හෝ එහි පාලනයෙන් පරිබාහිර ඕනෑම හේතූන් හෝ වැඩ වර්ජන හෝ සේවා ස්ථාන වසා දැමීමක් නිසා පැන නගින (ව්‍යාපාරයට) බාධාවන්.

19. ආයතනික කාඩ්පත්වල වගකීම

සුදුසුකම් ලත් ආයතනික දේහයන්ට ඒවායේ සේවක මණ්ඩල සාමාජිකයින්, විධායකයින්, අධ්‍යක්ෂවරුන් හෝ ආයතනික දේහය විසින් බලය පවරන ලද ඕනෑම වෙනත් පුද්ගලයෙකු වෙනුවෙන් නිකුත් කරන ලද සියලුම කාඩ්පත් ක්‍රියාත්මක වන්නේ ආයතනික දේහයේ මෙන්ම කාඩ් හිමියාගේ ද සාමූහික හා වෙන් වෙන්වූ වගකීම යටතේය.

20. බැංකුවේ පොත්පත්, වාර්තා සහ ගනුදෙනුකාර තොරතුරු

20.1 බැංකුවේ පොත්පත්, වාර්තා සහ ගිණුම තීරණාත්මක හා බැඳීම් සහගතය. බැංකුව විසින් නිකුත් කරනු ලබන ඕනෑම සහතිකයක්, මුද්‍රිතයක්, (Printout) හෝ ගිණුම් ප්‍රකාශනයක් ඒවායේ නිරවද්‍යතාවය පිළිබඳව ඕනෑම නීති කෘත්‍යයකදී හෝ වෙනත් ක්‍රියාවකදී ගනුදෙනුකරුට එරෙහිව අවසාන හා තීරණාත්මක සාක්ෂි වේ.

20.2 බැංකුව විසින් හෝ බැංකුව වෙතට යැවෙන දුරකථන පණිවුඩ කාඩ් හිමියාගේ හා බැංකුවේ අයිතීන් ආරක්ෂා කිරීම සඳහා පටිගත කෙරෙන බව කාඩ් හිමියා දැනුවත්ව පිළිගනී.

20.3 බැංකුව විසින් කාඩ් ගනුදෙනු පිළිබඳ දත්ත, තොරතුරු හා වාර්තා ඉලෙක්ට්‍රොනික ක්‍රමයකින් හෝ සූක්ෂම රූගත කිරීම් හෝ (ශ්‍රී ලංකාවෙන් බැහැර සැකසුම් මධ්‍යස්ථානද ඇතුලුව) වෙනත් ක්‍රම වලින් පවත්වා ගෙන යාම, සැකසුම් කිරීම හා ගබඩා කිරීම ගැන දැන සිටින බව හා ඊට එකඟ වන බව මෙයින් පිළිගන්නා අතර බැංකුවේ ලිපිගොනු, පොත්පත්, වාර්තා හෝ ගිණුම්වල උද්ධෘතයන් ලෙස බැංකුව විසින් ප්‍රදර්ශනය කරනු ලබන පණිවුඩ, කේබල්, ටෙලෙක්ස්, ෆැක්ස්, සූක්ෂම රූප (Micro Films), හඬ/රූ පටල පොත්පත්, වාර්තා හෝ ගිණුම් ඒවායේ අව්‍යාජ භාවය පිළිබඳ තීරණාත්මක සාක්ෂි බවට කාඩ් හිමියා තවදුරටත් එකඟ වේ.

20.4 බැංකුව තෙවන පාර්ශ්වයීය සාහායකයින් (Third Party Contracts) හෝ සේවාවන් භාවිතා කරන බවද එකී තෙවන පාර්ශ්වයට කාඩ් හිමියා සහ කාඩ් ගිණුම පිළිබඳ තොරතුරද ඇතුලු බැංකුවේ පොත්පත් හා වාර්තාවලට ප්‍රවේශයක් තිබිය හැකි බවද කාඩ් හිමියා දැනුවත්ව එකඟ වේ.

20.5 ගනුදෙනුකරුගේ බැංකුව සමග ඇති සම්බන්ධතාවය පිළිබඳ විස්තර (අයවීමට ඇති ශේෂයන්, ගිණුමේ පසුගිය තොරතුරු සහ කාඩ් හිමියා හා අදාළ තොරතුරු ඇතුලුව) බැංකුවේ වෙනත් ඕනෑම ශාඛාවකට, කාර්යාලයකට, බැංකුවේ ඕනෑම සම්බන්ධිත ආයතනයකට හෝ බැංකුවේ ඕනෑම සාමාජිකයෙකුට හෙළිදරව් කිරීම හා වාර්තා කිරීම; ශ්‍රී ලංකාවේ හෝ පිටත ඕනෑම නියාමන අධිකාරියකට උසාවි ආඥාවක් ඉටු කිරීම සඳහා; ඕනෑම ඇපකරුවෙකුට, තෙවන පාර්ශ්වයකට හෝ සුරැකුමක් සපයන්නෙකුට; බැංකුවේ ඕනෑම නියඳ ලාභියෙකුට; යොමුවක් ඉල්ලා සිටින ඕනෑම තෙවන පාර්ශ්වයකට සහ බැංකුවේ වෘත්තීමය උපදේශකවරුන්ට, නියෝජිතයින්ට සහ නිදහස් කොන්ත්‍රාත්කරුවන්ට හෙළිදරව් කිරීමට හා වාර්තා කිරීමට කාඩ්හිමියා එකඟවේ. එබඳු යම් හෙළිදරව් කිරීමක හෝ වාර්තා කිරීමක ප්‍රතිඵලයක් ලෙස උද්ගත විය හැකි ඕනෑම අලාභයක්, හානියක් හෝ අත්විඳී හෝ චෝදනා ලද හිරිහැරයක් සඳහා කාඩ් හිමියා විසින් කිසිදු ඉල්ලීමක් නොකරන අතර, මොනයම් හෝ ඉල්ලීමක් කිරීමට ඇති අයිතියද අත් හරිනු ලැබේ. කාඩ් හිමියා/හිමියන් තවදුරටත් බැංකුවේ කාඩ්පතක් නොදරන විටදී වුවද මෙම එකඟත්වය බලපැවැත්වෙනු ඇත.

20.6 කාඩ් හිමියා වෙත යොමු කිරීමක් නොමැතිවම බැංකුව විසින් සුදුසු යැයි අදහස් කරන ඕනෑම අවස්ථාවක කාඩ්පතක ඉල්ලුම්කරුවෙකුගේ/සහ/හෝ කාඩ් හිමියෙකුගේ ණය ස්ථාවරය (Credit Standing) පරීක්ෂා කිරීමට බැංකුවට අයිතිය හිමිවේ.

20.7 ගනුදෙනුකරුවෙකුගේ/ගනුදෙනුකරුගේ ව්‍යාපාරය බැංකුව හෝ බැංකුවේ සමූහ ව්‍යාපාර සාමාජිකයෙකු සමග පවත්වනු ලබන ගිණුම් කළ තොරතුරු (ඒවාට පමණක් සීමා නොවූ) ද ඇතුලුව කාඩ් ගිණුම් පිළිබඳ ඕනෑම තොරතුරක් ඕනෑම අවශ්‍යතාවයක් සඳහා පහත සඳහන් ඕනෑම අයෙකුට හෙළිදරව් කිරීමේ අයිතිය බැංකුව සහ/හෝ එහි ඕනෑම නිලධාරියෙක්/සේවකයෙක් වෙත රඳවා ගනී.

20.7.1 බැංකුවේ ඕනෑම ශාඛාවකට හෝ වෙනත් සමූහ ව්‍යාපාර සාමාජිකයෙකුට.

20.7.2 බැංකුවේ හෝ වෙනත් සමූහ ව්‍යාපාර සාමාජිකයෙකු මත බල සීමාව (Jurisdiction) පතුරුවන ඕනෑම නියාමන, සුපරීක්ෂණ, රාජ්‍ය අධිකාරියකට.

20.7.3 යම් හෙලිදරව් කිරීමක් කරන ලෙස නියම කරමින් සම්මත නීතියක් හෝ උසාවි ආඥාවක් මගින් බලය පවරනු ලැබූ ඕනෑම පුද්ගලයෙකුට.

20.7.4 බැංකුවට රහස්‍යතා යුතුකමක් යටතේ ක්‍රියා කරන ඕනෑම පුද්ගලයෙකුට.

21. **දුරකථන, ටෙලෙක්ස්, කේබල්, ෆැක්ස් හා විද්‍යුත් තැපෑල මගින් ලබා දෙන උපදෙස් සඳහා බලය පැවරීම සහ හාණිපූරණය**.

21.1 උපදෙස් ලබන අවස්ථාවේදී පවත්නා තත්ත්වයන් සැළකිල්ලට නොගෙන, මතු සඳහන් කරුණුවල සාමාන්‍ය අරුතට අගතියක් නොවන අයුරින් උපදෙස් දෙන හෝ දෙන බව කියන පුද්ගලයා සතු බලතල හා ඔහුගේ හැඳුනුම පිළිබඳව බැංකුව පාර්ශ්වයෙන් කිසිදු විමසීමක් නොකරම කලින් කලට කාඩ් හිමියන් විසින් තමන් වෙනුවෙන් දුරකථනය, ටෙලෙක්ස්, කේබල්, ෆැක්ස් හා විද්‍යුත් තැපෑල මගින් ලබා දෙන හෝ ලබා දෙන බව කියන ඕනෑම දැන්වීමක්, උපදෙසක්, ඉල්ලීමක් හෝ අනෙක් සංනිවේදනයක් (උපදෙස්) මත පිහිටා ඒ අනුව කටයුතු කරන ලෙස කාඩ් හිමියා බැංකුවට බලය පවරයි.

21.2 කාඩ් හිමියා දෙන උපදෙස් පූර්ණව බලාත්මක බවට හා ඔහුව බැඳීමකට යටත් කරවන බවට සැළකීමට බැංකුවට අයිතියක් ඇති අතර දෙනු ලබන උපදෙස් වල යම් වරදක්, ද්වීත්ව අර්ථයක්, වැරදි තේරුම් ගැනීමක් හෝ උපදෙස් වල අඩංගු කරුණු වල නොපැහැදිලි බවක් තිබියදී වුවද ඒ මගින් යම් මුදලක් ගෙවීමට හෝ නොගෙවීමට, ඕනෑම ගිණුමක් හර හෝ බැර කිරීමට, සම්බන්ධ කිරීමට, මුදල් හෝ ලියකියවිලි මුදා හැරීමට හෝ බැංකුව හෝ වෙනත් ඕනෑම පුද්ගලයෙකු සමග කාඩ් හිමියා ඇති කරගත් ඕනෑම ගිවිසුමකට හෝ වෙනත් වැඩ පිළිවෙලකට (ගිවිසුමේ හෝ වැඩ පිළිවෙලෙහි ස්වභාවය හෝ අදාළ මුදල් ප්‍රමාණය ගැන සැලකිල්ලට නොගෙන) හෝ කාඩ්හිමියා බැඳීමකට යටත් කළ හැකි වෙනත් වර්ගයක ගනුදෙනුවකට හෝ කුමන හෝ වැඩ පිළිවෙලකට එකී උපදෙස් සම්බන්ධයෙන් බැංකුව විසින් යෝග්‍යයැයි අදහස් කරන පරිදි ඒ උපදෙස් මත පිහිටා යම් සුදුසු පියවරයන් ගැනීමටද බැංකුවට අයිතිය ඇත.

21.3 බැංකුව මෙම බලාත්මක කිරීමේ නියමයන් හා හාණිපූරණය අනුව කටයුතු කිරීම සැලකිල්ලට ගෙන කාඩ් හිමියා මෙම උපදෙස් සම්බන්ධයෙන් හෝ ඒවා උල්ලංඝනය කිරීම නිසා හෝ මෙහි දක්වා ඇති පරිදි බැංකුව විසින් තම අයිතිවාසිකම් බලාත්මක

කිරීම හේතු කොට ගෙන කුමන අයුරකින් හෝ පැන නැගිය හැකි හා බැංකුවට දැරීමට හා විඳීමට සිදුවන ඕනෑම ආකාරයක නීතිමය හා වෙනත් සියලු අලාභ, ආදේශයන්, ක්‍රියාවන්, නීති කෘත්‍යයන්, ඉල්ලීම්, හානි, පිරිවැය, වගකීම් හා වියදම් වෙනුවෙන් බැංකුවට හාණිපූරණය කිරීමටත් ඒවාට එරෙහිව බැංකුවට වන්දි ගෙවීමටත් කාඩ් හිමියා නැවත වෙනස් කළ නොහැකි වන සේ මෙයින් භාර ගනී.

21.4 කාඩ් හිමියා වෙතින් සමාප්ත කිරීමේ නිවේදන බැංකුවට නොලැබෙන තාක් කල් හා ඒ අනුව කටයුතු කිරීමට සාධාරණ කාලයක් ලැබෙන තාක් කල් එකී නිවේදනය ලැබීමට පෙර මෙම බලාත්මක කිරීමේ, නියමයන් හා හාණිපූරණය පරිදි සිදු කරන ලද ඕනෑම ක්‍රියාවක් වෙනුවෙන් කාඩ් හිමියා මෙම බලාත්මක කිරීමේ හා හාණිපූරණය කිසිදු වගකීමකින් නිදහස් නොකරන්නේ නම් හැර මෙම බලාත්මක කිරීමේ නියමයන් සහ හාණිපූරණය පූර්ණ බලය හා අනුඵලය ඇතිව බල පවත්වනු ඇත.

21.5 ඉහතින් සඳහන් ව ඇති පරිදි දුරකථනය, ටෙලෙක්ස්, කේබල්, ෆැක්ස් හෝ විද්‍යුත් තැපෑල මගින් ලබා දෙන උපදෙස්, බැංකුවට උපදෙස් දීමට යොදා ගන්නා සුරක්ෂිත ක්‍රමයක් නොවන බව කාඩ් හිමියා පිළිගන්නා අතර එහිදී ඇතිවන අවදානම පිළිබඳව කාඩ් හිමියා දැන සිටින බවත් කාඩ් හිමියාගේ පහසුව සඳහා මෙහි දක්වා ඇති වැඩපිළිවෙලහි තනි වගකීම කාඩ් හිමියා සතු බවත් තහවුරු කරයි.

22. හිලව් කිරීමේ අයිතිය සහ සුරැකුම සඳහා රඳවා ගත් මුදල්

22.1 සාමාන්‍ය හිලව් කිරීමේ අයිතියට හා නීතිය හෝ වෙනත් ඕනෑම ගිවිසුමක් මගින් ප්‍රදානය කරන ලද අනෙකුත් හිලව් කිරීමේ අයිතීන්වලට අමතරවල කාඩ් හිමියා විසින් තනි තනිව හෝ බද්ධව බැංකුවේ පවත්වා ගෙන යනු ලබන ඕනෑම අයුරකින් විස්තර කෙරෙන හා ඕනෑම ස්ථානයක පවත්වා ගෙන යන හා ශ්‍රී ලංකාවේ රුපියල් වලින් හෝ වෙනත් මුදල් වර්ගයකින් හෝ අතිරේක කාඩ් හිමියා/හිමියන් සමග පවත්වනු ලබන බද්ධ ගිණුමක්/ගිණුම් ද ඇතුලුව කුමන හෝ අයුරකින් විස්තර කෙරෙන හා ඕනෑම ස්ථානයක පවත්වා ගෙන යන කාඩ් හිමියාගේ ඕනෑම ගිණුමකින්/ගිණුම් වලින් ශ්‍රී ලංකාවේ රුපියල් වලින් හෝ වෙනත් ඕනෑම මුදල් වර්ගයකින් බැංකුවට අයවීමට ඇති සියලුම මුදල් පියවා ගැනීම පිණිස බැංකුව සමග කාඩ් හිමියා පවත්වා ගෙන යන කුමන හෝ අයුරකින් විස්තර කෙරෙන කුමන හෝ ස්ථානයක පවත්වා ගෙන යන, ශ්‍රී ලංකා රුපියල් වලින් හෝ වෙනත් ඕනෑම මුදල් වර්ගයකින් ඇති සියලු ගිණුම් හෝ ඕනෑම ගිණුමක් බැංකුවට තම පූර්ණ අභිමතය මත ඕනෑම වේලාවක දැනුම් දීමකින් තොරව ඒකාබද්ධ කිරීමට හෝ (Consolidate) පූර්ණයනය කිරීමට හැකි බවට කාඩ් හිමියා එකඟ වන අතර එකී ගිණුමෙහි/ගිණුම්වල පවත්නා ශේෂයන් කුමක් වුවත් එබඳු යම් ඒකාබද්ධ කිරීමක්, පූර්ණයනය කිරීමක්, හිලව් කිරීමක් හෝ බැංකුව විසින් කලින් කලට තම පූර්ණ අභිමතය මත තීරණය කරන ලද බැංකුවේ එවකට බලපැවැත්වෙන විනිමය අනුපාතය පරිදි අවශ්‍ය පරිවර්තනයන් සහිත මුදල් මාරු කිරීමක් සිදු කිරීමට කාඩ් හිමියා මෙයින් බැංකුවට බලය පවරයි.

22.2 කාඩ් හිමියා ද ඇතුලුව ඕනෑම පාර්ශ්වයක වගකීම ඒ අයුරින්ම තබා ගැනීමේ බැංකුවට ඇති අවශ්‍යතාවය සපුරා ගැනීම සඳහා කාඩ් හිමියාගේ බුන්වත් බව හෝ ණය ගෙවීම් නොහැකියාව (පරීක්ෂිණතාවය) ඔප්පු කිරීම සඳහා හෝ රිට් ආඥාවක් හෝ සිතාසියක් නිකුත් කිරීමෙන් පසුව හෝ බැංකුව සුදුසු යයි අදහස් කරන වෙනත් හේතූන් සඳහා ඕනෑම වේලාවක බැංකුව ඥානාන්විත යයි අදහස් කරන කාල සීමාවක් තුළදී මෙහි පහත දැක්වෙන අයුරින් හෝ වෙනත් ඕනෑම සුරැකුමක් හෝ ඇපකරයක් යටතේ ලබාගත්, අයකරගත් හෝ නිෂ්කාශණය කරගත් ඕනෑම මුදලක් කාඩ් හිමියාගේ බැරට බැංකුව සුදුසු යයි සිතන ආකාරයට බැංකු පාර්ශ්වයට වෙනත් අන්තර් වගකීමකින් තොරව තබා ගැනීමටත් එම මුදල් හෝ ඉන් කොටසක් ගෙවීම් ප්‍රමාද වූ සහ බැංකුවට අයවිය යුතු මුදල් පියවීම සඳහා යොදා ගැනීමට බැංකුවට පුළුවන.

22.3 ණය මුදලක් සැපයීමේදී බැංකුව කාඩ් හිමියෙකුට අපගේ ඕනෑම ශාඛාවක තැන්පතු ගිණුමක සුරැකුමක් වශයෙන් මුදලක් තැන්පත් කරන ලෙස දැන්විය හැකිය. කාඩ්පතක අයවීමට ඇති මුදල මෙකී සුරැකුම් වලින් හිලව් කර ගැනීමේ අයිතිය බැංකුව රඳවා ගනී.

කාඩ් හිමියා ඕනෑම වෙලාවක එම අරමුදලට ප්‍රවේශ වීමට බලාපොරොත්තු වන්නේ නම් ඔහු ඒ බව කල්තියා බැංකුවට දැනුම් දී තිබිය යුතු අතර බැංකුව කාඩ් හිමියාගේ ණය කාඩ්පතේ හැසිරීම පාදක කරගෙන සිය පූර්ණ අභිමතය පරිදි තීරණයක් ගනු ඇත.

සුරැකුම් ලෙස රඳවා ගෙන ඇති මුදල් නිදහස් කිරීමට අනුමත කිරීමේ දින සිට වැඩ කරන දින 3ක් ගත විය හැක.

23. නීති කෘත්‍යයන්

කිසියම් හේතුවක් නිසා මෙම ගිවිසුමෙහි නියමයන් හා කොන්දේසි අනුව කටයුතු කිරීමට කාඩ් හිමියා අසමත් වන්නේ නම් බැංකුව මෙම කාඩ් ගිවිසුම අවලංගු කර ඒ යටතේ අයවීමට ඇති සියලුම මුදල් අයකර ගැනීමට කටයුතු කරනු ඇත. සියලුම පිරිවැය, ගාස්තු හා බැංකුව විසින් දරන ලද නීති ගාස්තු ද ඇතුලුව සියලුම වියදම් පූර්ණ හානි රක්‍ෂණ පදනම මත ගෙවීම කාඩ් හිමියාගේ වගකීම වනු ඇත.

24. දැන්වීම්

24.1 නමෙහි, රැකියාවෙහි හෝ ව්‍යාපාරයේ හෝ (කාර්යාලයෙහි හා/හෝ පදිංචි ලිපිනයෙහි) හෝ අදාල දුරකථන අංකවල සිදුවන වෙනස්වීම් කාඩ් හිමියා විසින් වහාම බැංකුවේ කාඩ් මධ්‍යස්ථානයට ලිඛිතව දැන්විය යුතුය.

24.2 මෙම නියමයන් හා කොන්දේසි යටතේ සියලුම කාඩ්පත් (PIN) රහස්‍ය අංක, ගිණුම් ප්‍රකාශන, ඉල්ලීම් හෝ වෙනත් සංනිවේදනයන් පුද්ගලිකව භාර දීම හෝ කුරියර් සේවය හෝ සාමාන්‍ය තැපෑල මගින් අවසාන වරට දැනුම් දී ඇති කාඩ් හිමියාගේ බිල්පත් ලිපිනයට හෝ වෙනත් ලිපිනයකට යවනු ලබන අතර එමගින් කාඩ් හිමියා වෙත අතින් භාර දී ඇත්නම්

එසේ භාර දෙන දිනයේ සිට හෝ කුරියර් හෝ තැපෑලෙන් යවන ලද්දේ නම් එසේ යවන ලද දින සිට වැඩ කරන දින තුනක් (03) ඇතුළත භාරදුන් බවට සැළකේ.

24.3 මෙම නියමයන් හා කොන්දේසි යටතේ ප්‍රාථමික කාඩ් හිමියා සහ/හෝ අතිරේක කාඩ් හිමියා වෙත යැවෙන සියලුම සංනිවේදනයන් දෙදෙනා වෙතම යවන ලද සංනිවේදනයන් සේ සැළකේ.

24.4 බැංකුවේ හෝ එහි නිෂ්පාදන/සේවාවන් පිළිබඳ සියලු අලෙවි තොරතුරු, විද්‍යුත් තැපෑල, කෙටි පණිවුඩ සේවා (SMS), ෆැක්ස්, තැපෑල, දුරකථනය ආදිය මගින් ලබා ගැනීමට කාඩ් හිමියා බැකුවට බලය පවරයි.

25. පොදු

25.1 කාඩ් හිමියාගේ උපදෙස් මත සද්භාවයෙන් කටයුතු කිරීම වෙනුවෙන් බැංකුව වගකීමක් නොදරයි.

25.2 එබඳු යම් උපදෙස් වාර්තා කිරීමට සහ එබඳු වාර්තා උසාවියකදී හෝ නීති කෘත්‍යයන්හිදී බැංකුවට තම අභිමතය පරිදි සාක්ෂි ලෙස යොදා ගැනීමට කාඩ් හිමියා බලය පවරයි.

25.3 මෙම ගිවිසුම යටතේ කාඩ් හිමියා වෙතින් බැංකුවට අයවිය යුතු සියලුම මුදල් අය කර ගැනීම සඳහා නියෝජිතයෙකු පත් කර ගැනීමට බැංකුවට අයිතිය තිබේ.

25.4 කාඩ් හිමියාගේ එකඟත්වය නොමැති වුවද මෙම ගිවිසුම යටතේ බැංකුවට ඇති අයිතීන් හා බැඳීම් සියල්ලම හෝ ඒවායින් කොටසක් හෝ කාඩ් හිමියා වෙත දැනුම් දීමක් කර හෝ සිදු නොකර ඕනෑම අවස්ථාවක නියඳ කිරීමට බැංකුවට අයිතිය තිබේ.

25.5 බැංකුව විසින් කලින් කලට ඉල්ලා සිටිනු ලබන යම් වැඩිමනත් ලියවිල්ලක් අත්සන් කිරීමට කාඩ් හිමියා භාර ගනී.

25.6 මෙහි ප්‍රතිපාදනය කර ඇති අයිතිවාසිකම් හා සහනයන් සමුච්චිත වන අතර නීතිය මගින් ප්‍රතිපාදන කර ඇති අයිතිවාසිකම් හෝ සහනයන් ඉන් බැහැර නොකෙරේ.

25.7 මෙහි දක්වා ඇති නියමයන් හා කොන්දේසි මගින් කාඩ් හිමියා බැඳ තබයි.

25.8 මෙහි දක්වා ඇති නියමයන් හා කොන්දේසි මගින් කාඩ් හිමියා බැඳී සිටින අතර එමගින් ලබන ඔහුගේ අයිතිවාසිකම් වෙනත් අයෙකුට ඔහු විසින් නියඳ නොකළ යුතුය.

25.9 බැංකුව ඕනෑම අවස්ථාවක කොන්දේසි සහිතව හෝ විරහිතව මෙහි සඳහන් කුමන හෝ නියමයක් හා කොන්දේසියක් සම්බන්ධයෙන් කාඩ් හිමියා විසින් කරනු ලබන කිසියම් පැහැර හැරීමක් හෝ කඩ කිරීමක් පිළිබඳව කටයුතු කිරීමට බැංකුවට ඇති අයිතිය අතහැරිය හැකි අතර බැංකුව විසින් එබඳු අත්හැර දැමීමක් ලිඛිතව දී ඇත්නම් සහ මේ නියමයන් හා කොන්දේසි වල පැහැර හැරීමක් හෝ කඩකිරීමක් පිළිබඳව පෙර සඳහන් පරිදි කොන්දේසි නොපැනවීමෙන් හෝ අවසර දීමෙන් බැංකුව පාර්ශ්වයෙන් මතුවට සිදුවිය හැකි සිද්ධීන් පිළිබඳව නොසැලකිලිමත් නොවන අයුරින් කර ඇත්නම් එය බැංකුවේ අයිතීන් සහ බලතල අත්හැර දැමීමක් ලෙස ක්‍රියාත්මක විය හැකි අතර බැංකුව විසින් ලිඛිතව ප්‍රකාශ කර නැත්නම් බැංකුව විසින් සිදු කළ හෝ සිදු නොකළ ක්‍රියාවක් බලතල හා අයිතීන් අත්හැර දැමීමක් සේ තේරුම් ගැනීමක් හෝ ගම්‍යමාන වීමක් ලෙස නොසැළකේ. ඕනෑම අත්හැර දැමීමක් එයටම අදාළ වන නියමිත කරුණ පිළිබඳව අත්හැර දැමීමක් ලෙස පමණක් ක්‍රියාත්මක විය යුතු අතර එය අනිත් නියමයන් හා කොන්දේසි කිසිවක් අත්හැර දැමීමක් හෝ ඒවායින් නිදහස් කිරීමක් ලෙස ක්‍රියාත්මක නොවිය යුතුය.

25.10 ඒ ඒ වෙළෙන්දන් විසින් දෙනු ලබන විශේෂ වට්ටම්/ප්‍රදානයන් සම්බන්ධයෙන් බැංකුව කිසිදු තඹැයුමක් (Warranty) නොදරන අතර, එකී ප්‍රදානයන්හි ඒ සම්බන්ධයෙන් සඳහන් කර ඇති භාර දීම, තත්ත්වය, මෝස්තරය හා පිරිවිතරයන් පිළිබඳ නියෝජනයක් කරනු නොලැබේ. එමෙන්ම මෙකී නිෂ්පාදන/සේවාවන් ඒවා තිබෙනතුරු පමණක් සැපයීමට යටත් වන අතර "පළමුව පැමිණෙන්නාට පළමුව සැපයීමේ" පදනම මත සපයනු ඇත.

25.11 ඒ ඒ වෙළෙන්දන් විසින් දෙනු ලබන විශේෂ වට්ටම්/ප්‍රදානයන් පිළිබඳව බැංකුව වග කියනු නොලැබේ.

25.12 බැංකුව විසින් තැපැල් කරන ලදුව භාර නොදී ආපසු හරවා එවනු ලැබීමේදී සහ කාඩ් හිමියා සම්බන්ධ කරගත නොහැකි වූ විට කාඩ් හිමියාගේ ප්‍රකාශන සහ/හෝ ලිපි හුවමාරු කාඩ් ඉල්ලුම් පත්‍රයේ නම් කර ඇති වෙනත් ලිපිනයකට නැවත යොමු කිරීමේ අයිතිය බැංකුව වෙත රඳවා ගනී.

25.13 කිසියම් ගනුදෙනුවක්/ගනුදෙනු කාඩ් හිමියා විසින් මතභේදයට ලක් කළ විට බැංකුව එබඳු ආරාවුල් පිළිබඳව විමර්ශනයක් කරනු ලැබේ. කෙසේ වෙතත් කාඩ් හිමියා ඒ පිළිබඳව නීති කෘත්‍යයන් අනුගමනය නොකරන්නේ නම් හෝ විමර්ශනයට සහාය වීමක් ලෙස බැංකුවට නොපැමිණෙන්නේ නම් හෝ ආරක්ෂිත කැමරා හා වෙනත් සාක්ෂි පිළිබඳ නිරීක්ෂණය නොකරන්නේ නම් විමර්ශන ක්‍රියාවලියේ දී වෙළෙන්දා විකුණුම් සැල්වලට හෝ ATM යන්ත්‍ර වෙත නොපැමිණෙන්නේ නම් මතභේදයට ලක්වූ සියලු ගනුදෙනු පිළිබඳව කාඩ් හිමියා වගකීමට යටත් විය හැකිය.

26. නියමයන්වල වෙනස් කිරීම

26.1 මෙම ගිවිසුමේ සඳහන් නියමයන් හා කොන්දේසි කලින් කලට බැංකුව විසින් වෙනස් කරනු ලැබිය හැකිය. එබඳු යම් වෙනස් කිරීම් පිළිබඳ දැන්වීම්වල ව්‍යවස්ථාපිත අවශ්‍යතාවයන්ට යටත්ව, ලිඛිතව හෝ ඒ පිළිබඳ ප්‍රකාශනයන් මාර්ගයෙන් කාඩ් හිමියා වෙත බැංකුව විසින් භාර දෙනු ලැබේ. එබඳු වෙනස් කිරීම් සියලුම නොගෙවන ලද මූල්‍ය ගාස්තු, ගෙවීම්, මූල්‍ය අත්තිකාරම්, පිරිවැය හා කාඩ් ගනුදෙනුවලට අදාළ කර ගනු ලැබේ.

26.2 මෙම ගිවිසුමේ සඳහන් නියමයන් හා කොන්දේසිවල එබඳු යම් වෙනස් කිරීම් කිරීමෙන් පසුව කාඩ්පත ළඟ තබා ගැනීම හෝ පාවිච්චි කිරීම, එකී වෙනස් කිරීම් කිසිදු සීමාවකින් තොරව කාඩ් හිමියා විසින් පිළිගැනීමක් සේ සැළකේ. කාඩ් හිමියා විසින් යෝජිත වෙනස් කිරීම් පිළිනොගන්නේ නම් එකී වෙනස්කිරීම ක්‍රියාත්මක වීමට පෙර දැනුම් දී කාඩ්පතේ භාවිතය අවසන් කළ යුතු අතර 17 වගන්තිය (සමාප්ත කිරීම) යටතේ ඇති තත්ත්වයන් ඉන්පසු ක්‍රියාත්මක වනු ඇත.

27. ගිවිසුමෙහි අනුඵලය (Effects)

27.1 මෙම ගිවිසුම සමාප්ත කිරීමක් සිදු වුවද මෙහි අඩංගු සියලු ප්‍රතිපාදන පූර්ණ බලයක් හා අනුඵලයක් සහිතව කාඩ් හිමියාට හෝ ඕනෑම අතිරේක කාඩ් හිමියාට/හිමියන්ට එරෙහිව සිදුකරන ඕනෑම කාඩ් ගනුදෙනුවක් සම්බන්ධයෙන් හා කාඩ් හිමියාගේ සහ/හෝ ඕනෑම අතිරේක කාඩ් හිමියෙකුගේ/හිමියන්ගේ වගකීමක් සම්බන්ධයෙන් දිගටම ක්‍රියාත්මක වනු ඇත.

27.2 මෙම සෑම නියමයක් හා කොන්දේසියක්ම වෙන් වෙන්ව හා එකිනෙකට වෙනස්ව පවතින අතර කිසියම් අවස්ථාවක යම් නියමයක් හෝ කොන්දේසි එකක් හෝ ඊට වැඩි ගණනක් අවලංගු වී, නීති විරෝධී වී හෝ බලාත්මක කළ නොහැකි වී ඇත්නම් හෝ මතුවට එසේ වන්නේ නම් ඉතිරි ප්‍රතිපාදන වල වලංගුභාවයට, නීතිමයභාවයට හෝ බලාත්මක කිරීමේ හැකියාවට ඒ හේතුකොටගෙන බලපෑමක් ඇති වීමක් හෝ එහි දුබලවීමක් සිදු නොවේ.

28. කාඩ් හිමියා විදේශයකට නික්ම යාම

කාඩ් හිමියකු විදේශයකට සංක්‍රමණය වන්නේ නම් හෝ විදේශයකට ස්ථිර රැකියාවක් සඳහා නික්ම යන්නේ නම් හෝ ඒ ඒ අවස්ථාවල බලපැවැත්වෙන විනිමය පාලන රෙගුලාසිවල අර්ථකථනය කර ඇති පරිදි "අනේවාසිකයකු" ලෙස සැළකෙන්නේ නම් ඒ බව ලිඛිතව බැංකුවට දැනුම් දීමට හා සියලුම බිල්ගත කරන ලද හෝ බිල්ගත නොකරන ලද හෝ ගාස්තු පියවා

දැමීමට කටයුතු කිරීමටත් ඔහුගේ කාඩ්පත හෝ අතිරේක කාඩ්පතද/පත්ද කාඩ් හිමියා නික්ම යාමට දින 30කට පෙරාතුව බැංකුවට ආපසු භාර දීමටත් කටයුතු කළ යුතුය. කාඩ්පත සහ අතිරේක කාඩ්පත/පත් පාවිච්චිය සමාප්ත වූවාක් සේ සැළකෙන අතර 17 වන වගන්තිය (සමාප්ත වීම) ක්‍රියාත්මක වනු ඇත.

29. විදේශිකයන් හට නිකුත් කරන ලද කාඩ්පත්

ශ්‍රී ලංකා මහ බැංකුව නිකුත් කළ එවකට බල පවත්වන රෙගුලාසිවලට යටත්ව විදේශිකයෙකුට කාඩ්පතක් නිකුත් කරනු ලැබිය හැකිය. ඔහු/හෝ ඇය නිත්‍ය පදිංචිය සඳහා ශ්‍රී ලංකාව හැර යන්නේ නම් මසකට පෙරාතුව සහ/හෝ ඔහුගේ නේවාසික වීසා බලපත්‍රයක් තිබේනම් නේවාසික වීසා බලපත්‍රය කල්පිරෙන දිනට දින 30ක් පෙරාතුව බැංකුව වෙත ලිඛිතව දැන්විය යුතුය. ඔහු/ඇය විසින්, බිල්ගත කරන ලද හා එසේ නොකරන ලද ගාස්තු සම්පූර්ණයෙන්ම පියවා කාඩ්පත/පත් ඉහත සඳහන් කවර හෝ සිදුවීමකට බැංකුව වෙත භාරදිය යුතුය.

30. විදේශ විනිමය ගනුදෙනුවලදී මුදල් මාරුකිරීම පිළිබඳ ගාස්තුව

ශ්‍රී ලංකා (රුපියල්) මුදල් නොවන මුදල් වර්ගවලින් කරනු ලබන සියලුම කාඩ් ගනුදෙනු එම මුදල් ශ්‍රී ලංකා මුදල් වලට හැරවීම කරනු ලබන දිනට අදාළව කාඩ් ගෙවීම් කරන සංවිධානය විසින් යොදවාගනු ලබන විනිමය අනුපාතයට අනුව ශ්‍රී ලංකා මුදල්වලට හරවා කාඩ් ගිණුමට හර කෙරෙන අතර ඊට අමතරව බැංකුව විසින් අය කරනු ලබන අතිරේක ප්‍රතිශතයක් හා අදාළ කාඩ් ගෙවීම්කරණ සංවිධානය විසින් බැංකුවට ගෙවීමට නියම කෙරෙන පරිදි ගනුදෙනු සඳහා වූ කිසියම් ගාස්තුවක්ද බැංකුව විසින් කාඩ් ගිණුමට හර කරනු ඇත.

31. පාලන නීතිය

31.1 මෙම නියමයන් සහ කොන්දේසි ශ්‍රී ලංකාවේ නීති මගින් පාලනය වන අතර ඒවා එම නීතිවලට අනුකූල විය යුතු බවද වටහා ගත යුතුය. කාඩ් හිමියා මෙහිදී නැවත වෙනස් කළ නොහැකි අයුරින් ශ්‍රී ලංකාවේ උසාවිවල අධිකරණ බලයට සුවිශේෂී ලෙස යටත් වේ. එම යටත්වීම කුමන අයුරකින් හෝ කාඩ් හිමියාට එරෙහිව නීති කෘත්‍යයක් ගෙන ඒමට බැංකුවට හිමි අයිතියට අගතියක් නොවිය යුතුය.

31.2 මෙම ගිවිසුමේ යම් වගන්ති නීතිය මගින්, රජයේ රෙගුලාසි මගින් හෝ ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නිකුත් කර උපදෙස් මගින් සංශෝධනය කිරීමක් වූ විට එම නියමයන් හා කොන්දේසිද මෙම ගිවිසුමෙහිද ස්වයංක්‍රීයව සංශෝධනය වේ. ඔබගේ කාඩ් ගිණුම භාවිතා කළ යුත්තේ නීත්‍යනුකූල හා වලංගු අවශ්‍යතාවයන් සඳහා පමණකි. කාඩ් ගිණුම හෝ කාඩ්පත වෙනත් ඕනෑම

අවශ්‍යතාවයකට ඔබ විසින්ම පාවිච්චි කිරීමේ දී හෝ තෙවන පාර්ශ්වයකට පාවිච්චි කිරීමට ඉඩ දීමේදී එබඳු පාවිච්චියක් හේතුකොටගෙන ඔබව වගකීමකට යටත් වන අතර එකී පාවිච්චියේ ප්‍රතිඵලයක් ලෙස බැංකුවට හෝ අදාළ කාඩ් ගිණුම් වෙනුවෙන් ගෙවීම් කරන සංවිධානයට හෝ සියලුම පාර්ශ්වයන්ට දරන්නට සිදු වූ සියලු මුදල්/වියදම් ප්‍රතිපූරණය කිරීමටද ඔබට සිදු විය හැකිය. එබඳු අවස්ථාවකදී එකී ගෙවීම් වහාම අත්හිටුවීමට හා එම කරුණ විනිමය පාලකවරයා වෙත දැනුම් දීමටද ඇති අයිතිය බැංකුව වෙත රඳවා ගනී.

31.3 ඔබගේ කාඩ් ගිණුමෙන් අවසර නොලත් විදේශ විනිමය ගනුදෙනු සිදු වන බවට සැක කිරීමට සාධාරණ හේතු පවතී නම් කාඩ්පතට විදේශ විනිමය ගනුදෙනු සිදු කිරීම සඳහා ඇති හැකියාව අත්හිටුවීමේ අයිතිය බැංකුව වෙත රඳවා ගනිමින් එම කරුණු විනිමය පාලකවරයාගේ දැනගැනීම සඳහා වාර්තා කළ යුතු වේ. කාඩ් හිමියකු කාඩ්පතක් භාවිතා කර සිදු කළ විදේශ විනිමය ගනුදෙනුවල තොරතුරු ලබාගැනීමේ අයිතිය බැංකුව වෙත රඳවාගනී.

31.4 කාඩ් හිමියා වෙනත් රටක පදිංචිය සඳහා හෝ රැකියාවක් සඳහා හෝ එතෙර නිත්‍ය වාසය සඳහා ශ්‍රී ලංකාවෙන් පිටව යන්නේ නම්, අනේවාසික විදේශ මුදල් ගිණුමක (NRFC), නේවාසික විදේශ මුදල් ගිණුමක (RFC), හෝ නේවාසික විජාතික විදේශ ව්‍යවහාර මුදල් ගිණුම (RNNFC) බැරට ඇති මුදල්වලින් පියවීම සඳහා කාඩ්පත නිකුත් කර ඇති නම් මිස, ඔහුට/ඇයට නිකුත් කළ කාඩ්පත බැංකුව වෙත භාරදිය යුතුය.

31.5 2005 වර්ෂයේ සැප්තැම්බර් 19 වන සඳුදා පළ කරන ලද ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අති විශේෂ ගැසට් පත්‍ර අංක 1411/5 (මෙයට අමුණා ඇත). මෙම නියමයන් හා කොන්දේසිවල අවශ්‍යම අනුකලන කොටසක් වන අතර කාඩ්පත මගින් විදේශ විනිමය ගනුදෙනු සිදු කරන්නේ නම් ඒවා කියවා තේරුම් ගෙන අදාළ කොටස් සුදුසු පරිදි යොදවා ගත යුතුය.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය
අති විශේෂ - අංක 1411/5: 2005 සැප්තැම්බර් 19 වැනි සඳුදා
1 වැනි කොටස: (1) වැනි ඡේදය - සාමාන්‍ය - ශ්‍රී ලංකා මහ බැංකුවේ දැන්වීම්
විනිමය පාලන පනතේ 7 වන වගන්තිය සහ 8 වන වගන්තිය (ල.නි.ප්‍ර වල 423 වන අධිකාරය)
ප්‍රකාරව වූ අවසරය

1. ශ්‍රී ලංකාව තුළ සිටින හෝ එහි නේවාසික යම් තැනැත්තෙකු විසින් තමාගේ විද්‍යුත් මුදල් මාරු කිරීමේ කාඩ්පත මගින් පහත දැක්වෙන නියමයන් සහ කොන්දේසි වලට යටත්ව, ශ්‍රී ලංකාවෙන් පිටත වාසික තැනැත්තෙකුට විදේශ ව්‍යවහාර මුදල් වලින් ගෙවීම් කිරීම සඳහා (ල.නි.ප්‍ර වල 423 වන අධිකාරය) විනිමය පාලන පනතේ 7 වන සහ 8 වන වගන්තිවල කාර්යයන් සඳහා මෙයින් අවසර දෙනු ලැබේ.

2. (අ) ශ්‍රී ලංකාවෙන් පිටත වාසික තැනැත්තෙකුට හෝ "නෛතික දේහයකට" අස්තිත්වයකට විද්‍යුත් මුදල් මාරු කිරීමේ කාඩ්පතකින් (ඊ.එෆ්.ටී.සී.) මුදල් ගෙවීම පහත සඳහන් කාර්යයන්ට පමණක් සීමාවිය යුතුය.

   i සංචාරක, නවාතැන්, වෛද්‍ය පහසුකම්, ජීවන හා අධ්‍යාපන වියදම් ඇතුලු පෞද්ගලික ස්වභාවයේ සේවාවන් සඳහා කාඩ්පත් හිමියකු විසින් විදේශ රටවලදී මුදල් ගෙවීම;
   ii විදේශ රටවලදී පෞද්ගලික ප්‍රයෝජනය සඳහා භාණ්ඩ මිලදී ගැනීම සඳහා මුදල් ගෙවීම්;
   iii එක් භාණ්ඩ තොගයක් සඳහා ඇමෙරිකානු එක්සත් ජනපද ඩොලර් 3000 ක (CIF) මි.ර.ගැ. හෝ වෙනත් යම් විදේශ ව්‍යවහාර මුදල් වලින් ඊට සමාන මුදලක උපරිමයකට යටත්ව පෞද්ගලික ප්‍රයෝජනය සඳහා ශ්‍රී ලංකාවට භාණ්ඩ ආනයනය කිරීම සඳහා මුදල් ගෙවීම;
   iv විදේශීය වෘත්තීය හෝ ශාස්ත්‍රීය ආයතනයකට ගෙවිය යුතු පෞද්ගලික ස්වභාවයේ ලියාපදිංචි වීමේ ගාස්තු, විභාග ගාස්තු සහ වාර්ෂික දායක මුදල් ගෙවීම;
   v පෞද්ගලික ස්වභාවයේ සංචාරක සහ සෞඛ්‍ය රක්ෂණ සඳහා පමණක් රක්ෂණ වාරික සම්බන්ධයෙන් ගෙවිය යුතු මුදල් ගෙවීම.

   (ආ) 2(අ) ඡේදයේ විෂය පථයට අයත් නොවන්නා වූ යම් ගනුදෙනුවක් සහ විද්‍යුත් මුදල් මාරු කිරීමේ කාඩ්පතකින් (ඊ.එෆ්.ටී.සී.) විදේශ ව්‍යවහාර මුදල් වලින් කරනු ලබන යම් ගෙවීමක් සඳහා, එම ගෙවීම අනේවාසික විදේශ ව්‍යවහාර මුදල් ගිණුමක (එන්.ආර්.එෆ්.සී.), නේවාසික විදේශ ව්‍යවහාර මුදල් ගිණුමක (ආර්.එෆ්.සී.), නේවාසික විජාතික විදේශ ව්‍යවහාර මුදල් ගිණුමක (ආර්.එන්.එන්.එෆ්.සී.) හෝ බලපත්‍රලාභී වාණිජ බැංකුවක අක්වෙරළ බැංකු ශාඛාවක අක්වෙරළ ගිණුමක බැරට, අරමුදල් වලින් ගෙවීම සඳහා අවසර දෙන ලද ගනුදෙනුවක් සම්බන්ධයෙන් වූ ගෙවීමක් වන්නේ නම් මිස, එම ගෙවීම සඳහා විනිමය පාලකවරයාගේ පූර්ව ලිඛිත අවසරය අවශ්‍ය වන්නේය.

3. පද සම්බන්ධයෙන් අන්‍ය අර්ථයක් අවශ්‍ය වන්නේ නම් මිස, ගැසට් නිවේදනයේ කාර්ය සඳහා "විද්‍යුත් මුදල් හුවමාරු කාඩ්පත" (ඊ.එෆ්.සී.) යන්නෙන් බැර, හර හෝ වෙනත් යම් ආකාරයක වටිනාකමක් මාරු කිරීම සඳහා භාවිතා කරන්නාට හැකිවන කාඩ්පතක් හෝ උපකරණයක් අදහස් වන අතර ඊට ණය කාඩ්පත් (ක්‍රෙඩිට් කාඩ්) හර කාඩ්පත් (ඩෙබිට් කාඩ්) සහ වටිනාකම තැන්පත් කළ කාඩ්පත් ද ඇතුළත් වේ.
සහ
"පෞද්ගලික ප්‍රයෝජනය" සඳහා යන්නෙන් කාඩ්පත හිමියාගේ, ඔහුගේ ස්වාමියා හෝ බිරිඳ සහ ඔහුගේ දරුවන්ගේ සහ දෙමව්පියන්ගේ ප්‍රයෝජනය යන්න අදහස් වන අතර එමගින් කාඩ්පත යම් වාණිජ කාර්යයන් සඳහා පාවිච්චි කිරීමක් අදහස් නොවේ.